# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயற்றிறன் அறிக்கை
# Annual Performance Report

# 2023

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**
**தேசிய திட்டமிடல் திணைக்களம்**
**நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு**

**Department of National Planning**
**Ministry of Finance, Economic Stabilization and National Policies**

**2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව**
**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව**
**වැය ශීර්ෂ අංකය 237**


| | පිටු අංකය |
|---|---|
| 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 3 |
| 1.1. හැඳින්වීම | 3 |
| 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 3 |
| 1.3. ප්‍රධාන කාර්යයන් | 4 |
| 1.4. සංවිධාන සටහන | 5 |
| 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ | 6 |
| 1.6. දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල් | 6 |
| 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේ නම්) | 6 |
| 02 පරිච්ඡේදය -ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 7 |
| 2.1 සමාජීය යටිතල පහසුකම් | 7 |
| 2.2 කෘෂිකර්ම | 13 |
| 2.3 කර්මාන්ත,වෙළෙඳ,ආයෝජන සහ සංචාරක | 19 |
| 2.4 වානිජ යටිතල පහසුකම් | 20 |
| 2.5 යහපාලන | 23 |
| 2.6 පරිසර කළමනාකරණය | 25 |
| 2.7 සමාජ ආරක්ෂණ | 27 |
| 2.8 ප්‍රාදේශිය සංවර්ධනය | 29 |
| 03 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 30 |
| 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 30 |
| 3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 31 |
| 3.3 මුදල් ප්‍රවාහක පිළිබඳ ප්‍රකාශය | 32 |
| 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් | 33 |
| 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 33 |
| 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය | 33 |
| 3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 34 |
| 3.8 මූල්‍ය නොවන වත්කම් භාවිතා කිරීමේ කාර්ය සාධනය | 34 |
| 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව | 35 |

04 පරිච්ඡේදය -කාර්ය සාධන දර්ශක 35

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව) 35

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 35

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 35
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 36

06 පරිච්ඡේදය -මානව සම්පත් පැතිකඩ 37

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 37
6.2 ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සහ කාර්ය සාධනය අතර සම්බන්ධතාවය 37
6.3 මානව සම්පත් සංවර්ධනය 37

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 44

# 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 1956 දී අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වය යටතේ ජාතික සැලසුම් සභාව ලෙස ආරම්භ වූ අතර රටේ සැලසුම් ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස සැලකිය හැකි මුළු රටම ආවරණය වන පරිදි සකස් කළ සවිස්තරාත්මක ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් ප්‍රථම වරට ඉදිරිපත් කරන ලදී. 1961 දී මෙම සභාව තවදුරටත් ශක්තිමත් කර අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස ස්ථාපනය කරන ලදී. ඒ යටතේ මෙම දෙපාර්තමේන්තුව කෙටිකාලීන සංවර්ධන වැඩසටහනක් සකස් කළ අතර සැලසුම් ක්‍රියාවලිය සඳහා ප්‍රවර්තන සැලසුම් සංකල්පය (rolling plan) ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී. පසුව, දෙපාර්තමේන්තුව 1965 දී සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත කර ප්‍රාග්ධන අයවැය සකස් කිරීම, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම පවරන ලදී. 1974 දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මුදල් හා සැලසුම් අමාත්‍යාංශය යටතට ගෙන එන ලද අතර එතැන් පටන් එය අනුප්‍රාප්තික රජයන් විසින් වරින් වර මුදල්, සැලසුම් හා ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා වගකිව යුතු අමාත්‍යාංශවලට අනුයුක්ත කරන ලදී. වර්තමානයේදී, ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා ලෙස, දෙපාර්තමේන්තුව සිය කාර්යය භාරය මූල්‍ය රෙගුලාසි අංක 3 (2) සහ අංක: 35 මගින් පවරා ඇති අධිකාරියට අනුකූලව සිදු කරනු ලැබේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ජාතියට වඩාත්ම දක්ෂ සංවර්ධන උපදේශක සහ පහසුකම් සපයන්නා වීම.

**මෙහෙවර**

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙන ඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම


**අරමුණු**

1. රාජ්‍ය ආයෝජන කාර්යක්ෂමව භාවිතා කිරීම
2. අදාල රේඛීය අමාත්‍යාංශ සහ ආයතනවල රාජ්‍ය ආයෝජන මගින් සමාජ ආර්ථික ප්‍රතිලාභ උපරිම වන ආකාරයට සංවර්ධන සැලසුම් සහ වැඩසටහන් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතවන පරිදි සකස්කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශකත්වය ලබාදීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- ජාතික හා ආංශික ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයට සහාය වීම
- ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම
- මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන රාමුව සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම
- රාජ්‍ය ආයෝජන සැලැස්මෙහි ව්‍යපෘති ප්‍රමුඛතාකරණය
- මූල්‍යමය සහය සඳහා සංවර්ධන ව්‍යාපෘති යොජනා ඇගයීම අනුමැතිය සහ නිර්දේශ සැපයීම
- කැබිනට් සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම
- අවශ්‍ය විටෙක නව සැලසුම් ක්‍රම යොදා ගැනීම
- අවශ්‍ය විටෙක ජාතික, උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීමට පහසුකම් සැපයීම
- විශේෂ/ කලාපීය සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මග පෙන්වීම
- ජාතික සැලසුම් ක්‍රියාවලියට තිරසාර සංවර්ධන ඉලක්ක ප්‍රධාන ධාරාවේ යෙදවීම
- විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන සඳහා සහයවීම
- සංවර්ධන හවුල්කරුවන් සමඟ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට පහසුකම් සැපයීම
- විශේෂ පැවරුම් සඳහා සහභාගී වීම
- අවශ්‍ය විටෙක කාලීන ගැටළු පිළිබඳ පත්‍රිකා සකස් කිරීම
- සැලසුම් හා අධීක්ෂණයට සම්බන්ධ ජාතික හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
- කාර්යමණ්ඩලයේ ධාරිතා සංවර්ධනය
- පොදු පරිපාලනය සහ මූල්‍ය

# 1.4 ආයතනික සටහන



## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලීම පිණිස දෙපාර්තමේන්තුව අංශ 8 කට වෙන් කර ඇත. එම අංශ 8 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ වලට වෙන් කර ඇත. එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරනු ලබන ව්‍යාපෘති යෝජනා ඇගයීම, රාජ්‍ය ආයෝජන ප්‍රතිපත්තිය සැකසීම, ප්‍රතිපත්ති සැකසීම සඳහා රේඛීය අමාත්‍යාංශ වෙත සහයෝගය ලබා දීම සහ අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

මීට අමතරව, සාර්ව ආර්ථික සැලසුම්කරණය, තොරතුරු බෙදා හැරීම සහ දෙපාර්තමේන්තුවේ පරිපාලනය සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනම ආධාරක ඒකක තුනක් ඇත.

1) තොරතුරු සංවර්ධන මධ්‍යස්ථානය
2) පරිපාලන අංශය
3) මූල්‍ය අංශය

**දෙපාර්තමේන්තුවේ අංශ**

- සමාජීය යටිතල පහසුකම්
- කෘෂිකර්ම
- කර්මාන්ත, වෙළෙඳ, ආයෝජන සහ සංචාරක
- වානිජ යටිතල පහසුකම්
- යහපාලන
- පරිසර කළමනාකරණ
- සමාජ ආරක්ෂණ
- ප්‍රාදේශීය සංවර්ධන

## 1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල්

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

(a)

1. **ව්‍යාපෘතියේ නම:** ලෝක බැංකු අධාර මත ක්‍රියාත්මක ආයෝජන ව්‍යාපෘති වල හදිසි ප්‍රතිචාර සංරචකය
2. **ආධාර දෙන ආයතනය:** ලෝක බැංකුව
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය -** රු.මිලියන 10,491
4. **ව්‍යාපෘති කාලය:** 2020.09.30 සිට 2023.03.30

(b)

1. ව්‍යාපෘතියේ නම : **Promoting Autonomy, Literacy and Attentiveness through Market Alliances (PALAM/A)**
2. ආධාර දෙන ආයතනය : එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රජයේ මුදල්
3. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය : ඇමරිකන් ඩොලර් මිලියන26 සහ රුපියල් මිලියන 140
4. ව්‍යාපෘති කාලය : **2021** සිට **2024**

(c)

1. **ව්‍යාපෘතියේ නම:** Inclusive Connectivity and Development Project Contingent Emergency Response Component (ICDP CERC) for Minimizing the Impact of the Economic Crisis and restoring Social Stability
2. **ආධාර දෙන ආයතනය: ලෝක බැංකුව**
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** : **ඇමරිකන් ඩොලර් මිලියන** 325
4. **ව්‍යාපෘති කාලය:** 09.05.2022 සිට 09.05.2024

(d)

1. **ව්‍යාපෘතියේ නම:** Food Security and Livelihood Recovery Emergency Assistant Project
2. **ආධාර දෙන ආයතනය: ආසියානු සංවර්ධන බැංකුව**
3. **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය** : **ඇමරිකන් ඩොලර් මිලියන** 203.36
4. **ව්‍යාපෘති කාලය:** 09.09.2022 සිට 31.08.2024

# 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 සමාජීය යටිතල පහසුකම්

### අධ්‍යාපන

රටක ශ්‍රම බලකායේ ගුණාත්මක භාවය ඉහළ නංවන සමාජ හා සංස්කෘතික වටිනාකම්වලින් පොහොසත් වගකීම් සහිත පුරවැසියන් බිහිකිරීමෙන් තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා රටක අධ්‍යාපන ක්‍රමය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව රටක ශ්‍රම බලකායේ දැනුම, කුසලතා, ආකල්ප සහ නිපුණතා වැඩිදියුණු කිරීම තුළින් පාසල්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපනික සහ වෘත්තීය ආයතනවලට රටක තිරසාර සංවර්ධනය සඳහා ඉමහත් දායකත්වයක් ලබා දිය හැකිය.

රටේ බොහෝ පාසල් නිදහස් අධ්‍යාපනයේ කොටසක් ලෙස රජය විසින් නඩත්තු කරනු ලැබේ ඒ අනුව, පාසල් පද්ධතිය රජයේ පාසල් 10,146 කින් (ජාතික පාසල් 396 ක් සහ පළාත් පාසල් 9,750 ක්) සමන්විත වන අතර රජයේ අනුමත පෞද්ගලික පාසල් 93 ක්, පිරිවෙන් පාසල් 819 ක් සහ විශේෂ පාසල් 30 ක් (විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා) ඇත. මීට අමතරව සමාගම් ලියාපදිංචි කිරීමේ නීතිය යටතේ ලියාපදිංචි ජාත්‍යන්තර පාසල් 300ක් පමණ රට පුරා ක්‍රියාත්මක වේ. රජයේ පාසල්වල මුළු ශිෂ්‍ය ජනගහනය මිලියන 4ක් පමණ වන අතර ගුරුවරුන් 241,054ක් මෙම පාසල්වල සේවය කරති.

කෙසේ වෙතත්, 2020 දී කොවිඩ් වසංගතය සහ 2021 දී ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට දැඩි බලපෑමක් එල්ල වී තිබේ. ආර්ථික ස්ථාවරත්වය සහ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අංශයේ ප්‍රතිසංස්කරණවල හදිසි අවශ්‍යතාවය හඳුනා ගැනීමෙන් පසු, මුල් ළමාවිය අධ්‍යාපනය, සාමාන්‍ය අධ්‍යාපනය (ප්‍රාථමික, කනිෂ්ඨ ද්විතීයික සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික), උසස් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය වැනි සියලුම අංශ ආවරණය වන පරිදි ඉදිරි වසර 10 ක කාලය (2023-2033) සඳහා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවක් (NEPF) සැකසීමට රජය කටයුතු කරමින් සිටී. තවද, මෙම අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව මඟින් අධ්‍යාපන පද්ධතිය සඳහා අවශ්‍ය පරිපාලන, විෂයමාලා සහ තක්සේරුව අවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා ද මූලපිරීම් යෝජනා කර ඇත.

**සාමාන්‍ය අධ්‍යාපන අංශයේ දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන වැඩසටහන් සහ ව්‍යාපෘති**

- පාසල් ආහාර වැඩසටහන
- සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ලෝක බැංකුව)
- ද්විතියික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ADB)
- තාක්ෂණ අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ OFID)
- තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය පිහිටුවීම (ශ්‍රී ලංකා රජය/ KOICA)
- ද්විතියික අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම (ශ්‍රී ලංකා රජය/EDCF)
- පාසල් ළමුන් සඳහා විවිධ සුභසාධන වැඩසටහන්

**2023 වසරේදී නිම කරන ලද කාර්යයන්**

- නිසියාකාරව සාධාරණීය කර ඇති ඇගයීම් වාර්තා 06 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට/ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ අදාළ රේඛීය ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- අධ්‍යාපන අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 20ක් සඳහා නිරීක්ෂණ සකස්කිරීම.
- අධ්‍යාපන අංශයට අදාළව අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කිරීම.
- විවිධ පාර්ශ්ව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද විවිධ වාර්තා/ලේඛන/සැලසුම් සඳහා අදහස්/නිරීක්ෂණ සකස්කිරීම .

**උසස් අධ්‍යාපන**

රටක සමෘද්ධිය මනිනු ලබන්නේ මානව සම්පත සතු ගුණාත්මක භාවය තුළිනි. මෙහිදී රජය අරමුණු කරන්නේ මානව සම්පත් සංවර්ධනය තුළින්, විශේෂයෙන්ම සමාජ - ආර්ථික සංවර් ධනයේ තීරණාත්මක සාධකයක් ලෙස අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම තුළින්, ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි. එබැවින්, උසස් අධ්‍යාපනයේ විභව ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහ ඵලදායී හා සමාජයට වැඩදායී පුරවැසියන් බිහිකිරීමේ දී රාජ්‍ය අරමුදල් ආයෝජනය කිරීම සඳහා රජය විවිධාකාර ප්‍රයත්නයන් දරනු ලබයි. දක්ෂ අධ්‍යාපන සුදුසුකම් සහිත රැකියා කළ හැකි පුද්ගලයන් නිර්මාණය කිරීම රජය මුහුණ දෙන තීරණාත්මක අභියෝගයකි. තාක්ෂණික පරිණාමය සහ ගෝලීයකරණයත් සමඟ උසස් අධ්‍යාපනය අවස්ථා සඳහා වැඩි වෙමින් පවතින ශිෂ්‍ය සංචලනයන්ට ශ්‍රී ලංකාව තුළ නව මං පෙත් විවෘත වී ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයට අනුව රජයේ පාසල්වල පළමු ශ්‍රේණියට වාර්ෂිකව සිසුන් 330,000ක් පමණ ඇතුළත් කර ගනී. කෙසේවෙතත්, විශ්වවිද්‍යාලවල පවතින සීමිත ධාරිතාව හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති සමස්ත සිසුන් සංඛ්‍යාව අතරින් වාර්ෂිකව 20% -25% කට ආසන්න සිසුන් සංඛ්‍යාවක්, රජයේ විශ්ව විද්‍යාල සඳහා තෝරා ගනී. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය විශ්වවිද්‍යාල දාහතක්, පාර්ලිමේන්තු පනත් යටතේ ස්ථාපිත විශ්වවිද්‍යාල පහක් සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රතීතනය කරන ලද රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 23ක් (NSHEI) පවතී. තවද, උපාධි පිරිනමන පෞද්ගලික විශ්වවිද්‍යාල රාශියක් රට තුළ ක්‍රියාත්මක වන නමුත්, ඒවා අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ අධීක්ෂණය නොවේ.

**සම්පූර් ණ කරන ලද ක්‍රියාකාරකම්**

- රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සඳහා ඇගයුම් වාර්තා 08ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට/ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
- උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 13ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම.
- උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ සහභාගි වීම.
- විවිධ පාර්ශවයන් විසින් සකස් කර ඉදිරිපත් කරන ලද විවිධ වාර්තා/ලේඛන/සැලසුම් සඳහා අදහස් සහ නිරීක්ෂණ ලබා දීම.
- මානව සම්පත් සංවර්ධනයට අදාළ විවිධ පාර්ශ්වකරුවන් විසින් සංවිධානය කරන ලද වැඩමුළු / පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම.

**නිපුණතා අධ්‍යාපන**

රට තුළ පවතින තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු (TVET) බෙදාහැරීමේ ජාලය සැලකිල්ලට ගනිමින්, රාජ්‍ය, පෞද්ගලික, පුණ්‍යායතන සහ රාජ්‍ය නොවන ආයතන වශයෙන් දිවයින පුරා ලියාපදිංචි වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන 1,500ක් පමණ දැනට ක්‍රියාත්මක වේ. මෙම ආයතන වර්ග තුන අතර ප්‍රමුඛයා ලෙස රාජ්‍ය අංශය දිගටම පවතී. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු

නියාමනය සඳහා නියම කර ඇති ඉහළම ආයතනය ලෙස ක්‍රියා කරන අතරම රට තුළ මෙම අංශයේ සමස්ත නියාමනය සඳහා සහභාගී වේ. ඒ අනුව, රැකියා විරහිත තරුණ තරුණියන්, ග්‍රාමීය කාන්තාවන්, පාසල් හැර යන අය සහ අර්ධ පුහුණු හෝ නුපුහුණු ශ්‍රමිකයන් ඉලක්ක කර ගනිමින් වාර්ෂිකව සිසුන් 100,000කට වැඩි සංඛ්‍යාවක් ඇතුළත් වන ලියාපදිංචි පාඨමාලා 7,000ක් සහ ප්‍රතීතනය ලත් පාඨමාලා 3,000ක් පමණ දැනට රට පුරා ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාව වැනි වර්ධනය වන ආර්ථිකයන්හි තරුණ තරුණියන්ට කාර්මික අංශ සමඟ සම්බන්ධ වීමට මෙන්ම නිපුණතා හිඩැස් පිරවීම සඳහා නිපුණතා ලබා ගැනීමට හොඳ තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු පද්ධතියක් තිබිය යුතුය. ඒ අනුව, රටේ ජාතික, ආර්ථික සහ සමාජීය සංවර්ධන ක්‍රියාවලියේදී ඉහළ නිපුණතා සහ නිපුණ ශ්‍රම බලකායක් සිටීමේ වැදගත්කම රජය විසින් හඳුනාගෙන ඇත. ඊට සමගාමීව, යෝජිත ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPF) යටතේ වෘත්තීය අධ්‍යාපන අංශයේ මූලපිරීම් ප්‍රතිසංස්කරණය කිරීමට රජය කටයුතු කර ඇත.

**නිපුණතා අධ්‍යාපන අංශයේ දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන වැඩසටහන් සහ ව්‍යාපෘති**

- TVET වෘත්තීය වේදිකා ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ KOICA)
- කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ ගම්පහ කාර්මික විද්‍යාලය පිහිටුවීම (ශ්‍රී ලංකා රජය/EDCF)
- නියාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම (ශ්‍රී ලංකා රජය/ KOREA)
- ශ්‍රී ලංකාවේ තාක්ෂණ වෘත්තීය පුහුණු විද්‍යාල 7ක් නවීකරණය කිරීම (ශ්‍රී ලංකා රජය/ ජර්මනිය)
- Youleed ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය /USAID)
- "නිපුනතා සිසු දිරිය" සුබසාධන වැඩසටහන

**2023 වසරේදී නිම කරන ලද කාර්යයන්**

- නිසියාකාරව සාධාරණීය කර ඇති ඇගයීම් වාර්තා 05 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට/ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට සහ අදාළ රේඛීය ආයතන වෙත ඉදිරිපත් කිරීම
- නිපුණතා අධ්‍යාපන අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 02ක් සඳහා නිරීක්ෂණ සකස්කිරීම

- නිපුණතා අධ්‍යාපන අංශයට අදාළව අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා සංවිධානය කිරීම.

- විවිධ පාර්ශ්ව විසින් සකස් කර ඉදිරිපත් කරන ලද විවිධ වාර්තා/ලේඛන/සැලසුම් සඳහා අදහස්/නිරීක්ෂණ සකස්කිරීම .

**තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය**

ඩිජිටල්කරණය තුලින් සවිබල ගැන්වූ ශ්‍රී ලංකාවක් කරා යන ගමනේ දී, එය සියල්ලන් ඇතුළත්වන, නව්‍ය සහ තිරසාර සංවර්ධනය, මානව කේන්ද්‍රීය සහ මානව අයිතිවාසිකම් පදනම් වූ මූලධර්මවල වැදගත්කම හඳුනාගෙන ඇත. ආර්ථික ක්ෂේත්‍ර ඩිජිටල්කරණය,

වේගවත් ආර්ථික ප්‍රකෘතිය(recovery) ට සහාය වනු ඇති අතර රටේ සංවර්ධන ඉලක්ක කාලෝචිත ලෙස සාක්ෂාත් කර ගැනීම සහතික කරනු ඇත.

අනුව, සම්බන්ධතාවය(connectivity) සහ ප්‍රවේශය(access), තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව, රාජ්‍ය කටයුතු ඩිජිටල්කරණය, ආරක්ෂාව, ඩිජිටල් මූල්‍යකරණය සහ ආර්ථික ක්ෂේත්‍ර ඩිජිටල්කරණය වැනි තේමාත්මක කුළුණු 6ක් හරහා ආර්ථිකය ඩිජිටල් ආර්ථිකයක් කරා පරිවර්තනය කිරීමට රජය අපේක්ෂා කරයි.පෞද්ගලික ආයෝජන හරහා එම ප්‍රයත්නය දිරි ගැන්වෙනු ඇත.

ක්‍රියාකාරකම්

• **තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය** විෂයට අදාළ ව්‍යාපෘති යෝජනා 10 ක් ඇගයීම් කර නිර්දේශ ලබා දෙන ලදී.

• අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

**විද්‍යාව සහ තාක්ෂණය**

පර්යේෂණ සහ සංවර්ධන (R&D), නවෝත්පාදන, තාක්ෂණික දියුණුව ආර්ථිකයන්හි ආර්ථික වර්ධනය බහු ගුණයකින් ඉහළ යාමට හේතු වන ප්‍රධාන පරාමිතීන් වේ. එම පරාමිති මඟින් ශ්‍රම බලකායේ නිපුණතා වැඩි දියුණු කිරීම තුළින් ඔවුන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීමට රටට හැකියාව ලැබේ. තාක්ෂණික නවෝත්පාදනයන්, දැනුම නිර්මාණය කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම ආදිය ආර්ථික පසුබෑම සහ ආර්ථිකයේ අනෙකුත් ගැටළු සඳහා විසඳුම් කරා ළඟා වීමට මාර්ග සහ විධි වේ.

ක්‍රියාකාරකම්

• විද්‍යාව හා තාක්ෂණය විෂයට අදාළ ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව 2 ක් ඇගයීම් කර නිර්දේශ ලබා දෙන ලදී .

• අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ රැස්වීම් සහ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

**සෞඛ්‍ය**

2023 වසරේ, සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා, රජයේ අභිප්‍රාය වූයේ, රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ සාමාන්‍ය ජනතාවට අඛණ්ඩ සෞඛ්‍ය සේවාවක් ලබාදීම සඳහා ඖෂධ සහ උපකරණ ලබා ගැනීම සහතික කිරීමයි. සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය ඇතිව ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ආධාර ලබා ගැනීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සහ රේඛීය අමාත්‍යාංශ සමඟින් පහසුකම් සලසන ලදී. ඒ අනුව, අත්‍යාවශ්‍ය ඖෂධ, ශල්‍ය උපකරණ සහ රසායනාගාර ප්‍රතික්‍රියාකාරක සැපයීම සඳහා විශේෂයෙන්ම ඉන්දීය ණය පහසුකම් වැඩසටහන සහ ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි සංවර්ධන හවුල්කරුවන් හරහා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අනෙකුත් සෞඛ්‍ය ආධාර සපයන්නන් සමඟ සම්බන්ධ වෙමින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විශාල කාර්යභාරයක් ඉටු කරන ලදී. ඊට අමතරව සෞඛ්‍ය අංශයට, විශේෂයෙන්ම ඖෂධ සැපයුම් සහ අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා රජය අතිරේක ප්‍රතිපාදන ලබා දී ඇත.

ඒ අනුව, 2023 වර්ෂය ආරම්භයේ දී රජය විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන ආයෝජනය සඳහා රුපියල් මිලියන 55,000 ක ප්‍රතිපාදනයක් වෙන් කළ අතර එම වසරේ අග භාගය වන විට මිලියන 62,687 ක් දක්වා ඉහළ නන්වන ලදී. රේඛීය අමාත්‍යාංශය හරහා ලබා දෙන ලද මෙම ප්‍රතිපාදනයට අමතරව, ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට මුදල් කොමිෂන් සභාව හරහා පළාත් සභා වෙත රුපියල් මිලියන 13,000ක් ද වෙන් කරන ලදී.

ඉහත ක්‍රියාකාරකම්වලට අමතරව, අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් පරිදි, 'සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ රජයේ වියදම් තාර්කික කිරීම පිළිබඳ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු' වාර්තාව සකස් කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව පහසුකම් සලසා දෙන ලදී. එම වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර එම වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති යෝජනා 11ක් ඇගයීම් සිදු කර ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත. ඊට අදාල නිරීක්ෂණ අදාළ රේඛීය අමාත්‍යාංශය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
- සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 08 සඳහා නිරීක්ෂණ ලබා දී ඇත.
- සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති යෝජනා 01 සඳහා මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් නිරීක්ෂණ සහ යෝජනා සපයා ඇත.
- සෞඛ්‍ය අංශය සඳහා ඉදිරි වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යෝජනා වී ඇති ව්‍යාපෘති සලකා බලා ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කරන ලදී.
- සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක වන විදේශ ආධාර සපයන ව්‍යාපෘති වලට අදාලව රැස්වීම් පවත්වා අදාල නිරීක්ෂණ, ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව වැනි මූල්‍ය ආධාර සපයන ආයතන වල නියෝජිතයන් වෙත ඉදිරිපත් කරන ලදී.

**ක්‍රීඩා**

නිපුනතා සපිරි, නීරෝගිමත් විනයගරුක මානව සම්පතක් බිහි කිරීම සඳහා ක්‍රීඩා සංස්කෘතියක් සමාජය තුළ ස්ථාපනය කිරීම ක්‍රීඩා අංශයේ ප්‍රධාන අරමුණයි. එහිදි, පාසල් මට්ටමේ සිට දරුවන් ක්‍රීඩාශීලීත්වයට හුරු කිරීම, විශේෂ ක්‍රීඩා කෞශල්‍යයන්ගෙන් යුත් දරුවන් හඳුනාගෙන ඔවුන් ජාත්‍යන්තරය දක්වා යොමුකිරීම, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය, ක්‍රීඩා උපදේශකයන්ගේ ධාරිතා සංවර්ධනය අවශ්‍ය පහසුකම් සැලසීම අපේක්ෂා කෙරේ.

ක්‍රීඩා අංශය, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබාදීම හා ජාතික/ආංශික සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා දායකත්වය ලබා දේ. ඒ අනුව ක්‍රීඩා අංශය 2023 වර්ෂය තුළ ව්‍යාපෘති යෝජනා 03ක් ඇගයීමට ලක් කර අවශ්‍ය නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදි. තවද රේඛිය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 06 ක් සඳහා මුදල්,

ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් නිරීක්ෂණ ලබාදෙන ලදී.

## 2.2 කෘෂිකර්ම

**කෘෂිකාර්මික**

රටේ ජනගහනයෙන් හතරෙන් පංගුවකට වඩා වැඩි පිරිසකගේ ප්‍රධානතම ජීවනෝපාය වන කෘෂි අංශය ජාතික හා ගෘහාශ්‍රිත ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවයට දායක වන අතරම ආර්ථිකයේ අනෙකුත් අංශ සමඟ සිරස් සහ තිරස් ඒකාබද්ධතාවය තුළින් රටේ ආර්ථික හා සාමජයීය සංවර්ධනය උදෙසා සැලකිය යුතු දායකත්වයක් දක්වනු ලබයි. රටේ මුළු භූමි ප්‍රමාණයෙන් , ඉඩම් වලින් 40%කට ආසන්න ප්‍රමාණයක් වගා කිරීමට සුදුසු වන අතර ඉන් 65%ක් (හෙක්ටයාර මිලියන 1.9) කට ආසන්න ප්‍රමාණයක් වගා කෙරේ. වගා කරන භෝග අතරින් වී සහ වැවිලි භෝග (ප්‍රධාන වශයෙන් තේ, රබර් සහ පොල්) වගා කෙරෙන භූමි ප්‍රමාණයෙන් 36%ක් බැගින් වේ. කෘෂි අංශයේ ප්‍රාථමික නිෂ්පාදනය මෑත දශකය තුළ රටේ දළ ජාතික නිෂ්පාදනයෙන් (GDP) 7-8% ක් පමණ විය. කෘෂිකාර්මික අංශයේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 2,500 ක් පමණ වේ (වාර්ෂික වාර්තාව, CBSL-2022) එය රටේ මුළු අපනයන ආදායමෙන් 19.6% කට ආසන්න වේ.

කෘෂිකාර්මික අංශයේ වර්ධනය ගෝලීය වශයෙන් ජීවනෝපාය සහ රැකියා උත්පාදනය, අපනයන ආදායම හරහා ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවය සහ ආර්ථිකය සඳහා ප්‍රමුඛ දායකත්වයක් ලබා දේ. කෘෂි නිෂ්පාදනය භූගෝලීය වශයෙන් සමාන ලෙස පැතිරී නොමැත. මෙහිදී නිෂ්පාදනය පුළුල් කිරීමට, නිෂ්පාදන විශේෂඥතාවයට සහ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට තීරණාත්මක සාධකයක් ලෙස භූමිය බලපාන අතර ඒ අනුව කෘෂි අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට තාක්ෂණය උපයෝගී කර ගනිමින් කෘෂි අංශය නවීකරණය කිරීම එම අංශයේ කැපී පෙනෙන තිරසාර වර්ධනයක් ඇති කිරීම සඳහා විකල්පයක් බවට පත්ව ඇත.
කෘෂිකර්ම ප්‍රතිපත්තියේ ප්‍රධාන අංශ දෙක වනුයේ ආහාර සුරක්ෂිතතාව සහ අපනයන ප්‍රවර්ධනය සාක්ෂාත්කර ගැනීමයි. ඒ සඳහාත් සියළුම පාර්ශව ඇතුලත් සංවර්ධනයක් ළගාකර ගැනීම සඳහාත් ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කරමින්, සාමාජීය වශයෙන් පිළිගත හැකි නව්‍ය සහ ගෝලීය වශයෙන් තරඟකාරී වාණිජමය කෘෂි නිෂ්පාදනය, සැකසුම් සහ වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමත් අරමුණු කරගෙන ඇත.

**ආහාර බෝග කෘෂිකර්මාන්තය**

ආහාර බෝග කෘෂිකර්මාන්තය මගින් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කරනු ලැබේ. වසංගත , අයහපත් දේශගුණික තත්ත්වයන් සහ නිෂ්පාදන යෙදවුම්වල මිල ඉහළ යාම හේතුවෙන් සැපයුම් ජාලය කඩාකප්පල් වීම නිසා ඇති වූ ගෝලීය ආහාර අර්බුදයේ බලපෑම මේ වන විට, විවිධ රාජ්‍ය මැදිහත්වීම් සහ කෘෂි අංශයේ සිදු කළ ප්‍රතිසංස්කරණ තුළින් දේශීය ආහාර වෙළඳපොළ වෙත යොමු වීම අවම කර ඇත. ආහාර නිෂ්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ගොවීන්ට / නිෂ්පාදකයන්ට සහන ණය සහ මූල්‍ය දිරිගැන්වීම් ලබා දෙන ලදී. තවද පුද්ගලික අංශය මෙන්ම සහභාගීත්ව වෙළඳපොළ තුළ තරඟකාරීව සිටීමට ආහාර හා අගය දාමයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් අනාගත ව්‍යවසායකයින් සඳහා සහන ණය සහ ගැළපෙන ප්‍රදාන පහසුකම් ද සපයා දීමට කටයුතු කරන ලදී.

දේශීය කෘෂිකාර්මික අංශය නවීන , හරිත කෘෂිකාර්මික අංශයක් බවට පත් කිරීම මඟින් එම අංශයේ වර්ධනය යථා තත්ත්වයට පත් කිරීමට විචක්ෂණශීලිව රජයේ මැදිහත්වීම් සිදු වෙමින් පවතී. මේ සඳහා ප්‍රධාන වශයෙන් යැපුම් මට්ටමේ කුඩා ගොවි ඒකක වලින් සමන්විත ගෘහස්ථ කෘෂිකාර්මික අංශයේ ව්‍යුහාත්මක වෙනස්කම් අවශ්‍ය වේ. ඒ අනුව, කෘෂි නිෂ්පාදනවල ඵලදායිතාව වැඩිදියුණු කිරීම, පෙර සහ පසු අස්වනු හානි අවම කිරීම, අවදානම් සහ අවිනිශ්චිතතා කළමණාකරණය කිරීම, අගය දාමය සහ තරඟකාරීත්වය ශක්තිමත් කිරීම සහ ව්‍යාප්ති සේවා පුළුල් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ. කෘෂිකර්මාන්තය සඳහා වන රජයේ වියදම් ක්‍රමානුකූලව සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව (PERC) පත් කරන ලද අතර, තිරසාර ලෙස ආදායම් උත්පාදනය ඉහළ නංවමින් වියදම් අඩු කරමින් කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ ක්‍රමවේද එහි දී නිර්දේශ කරන ලදී. ඒ අනුව කාෂිකාර්මික අංශයේ රජයේ වියදම් එම කමිටුව විසින් සමාලෝචනය කර ඇති අතර ක්ෂේත්‍රයේ මූල්‍ය සහ අනෙකුත් සම්පත් ඵලදායීව කළමණාකරණය කිරීම සහ කාර්යක්ෂමව භාවිතා කිරීම තුළින් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සඳහා රාජ්‍ය ආයෝජන ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීම ,දේශීය පරිභෝජනය සඳහා මෙන්ම අපනයනය සඳහා ඉහළ ගුණාත්මක කාෂිකාර්මික නිෂ්පාදනයක් සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම , අගය එකතු කිරීම ප්‍රචලිත කිරීම සඳහා සහාය ලබා දීම සහ උපදෙස් ලබා දීම ආදිය ප්‍රමුඛ කාර්යයන් ලෙස හඳුනාගෙන ඇත.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික අංශය විසින් සම්පූර්ණ කරන ලද කාර්යයන්.**

- ව්‍යාපෘති යෝජනා 16 ක් ඇගයීම් සිදු කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදි.
- කාෂිකර්ම අමාත්‍යාංශය සහ අදාළ අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 07 ක් සඳහා අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ සහ තාක්ෂණික අදහස් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

**විශේෂ කාර්යයන්**

- ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි “Modernization of Agriculture” පිළිබඳ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් සකස් කර ඉදිරිපත් කරන ලදී.
- ජනාධිපති ලේකම් කාර්යාලයේ ආහාර සුරක්ෂිතතා අංශයේ උපදෙස් පරිදි සහ “Paddy Stock and Forecast “පිළිබඳ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලදී.
- “Food System Transformation and Rural Recovery” පිළිබඳ ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාවක් පිළියෙළ කර KOICA මූල්‍ය ප්‍රදාන ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.
- ජනාධිපත් ලේකම් කාර්යාලයේ ආහාර සුරක්ෂිතතා අංශය විසින් සංවිධානය කරන ලද “Food Security Policy Framework” පිළිබඳව වූ පාර්ශවකරුවන්ගේ රැස්වීම්වලට සහභාගී වීම
- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීම් ආයතනය (HARTI) විසින් පවත්වන ලද පර්යේෂණ සංසදයට සහභාගි වී තාක්ෂණික යෙදවුම් ලබා දීම.
- ජනාධිපති ලේකම් කාර්යාලයේ කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම හා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම

- Sri Lanka Institute of Agriculture විසින් සංවිධානය කරන ලද කෘෂිකාර්මික සම්මන්ත්‍රණය සඳහා සම්පත් දායකයෙකු ලෙස සහාය වීම සහ සම්බන්ධ වීම
- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් කෘෂිකාර්මික අංශයේ ආයතනික සමාලෝචනය සඳහා පත් කරන ලද කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව සහය සටහන (Aide Memoire) සඳහා නිරීක්ෂණ ලබා දීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම

**පශු සම්පත්**

පශු සම්පත් අංශය විශේෂයෙන් රටේ ග්‍රාමීය ප්‍රදේශවල මිලියන 1.6 ක පමණ ජනගහනයකට පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සඳහා දායක වන ප්‍රධාන උප අංශයකි. දළ දේශීය නිෂ්පාදිතයට 1% කට වඩා අඩු දායකත්වයක් දැක්වුවද, එම ක්ෂේත්‍රය සඳහා වන ශ්‍රම අවශ්‍යතාවය හේතුවෙන්, ග්‍රාමීය රැකියා උත්පාදනය, දරිද්‍රතාවය පිටුදැකීම සහ එමඟින් ආර්ථික සංවර්ධනයට මග පෑදීම සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්ෂේත්‍ර අතරට එය එක් වේ. මෙම අංශයට ප්‍රධාන වශයෙන් ගවයින්, මී හරකුන්, එළුවන්, කුකුළන් සහ ඌරන් ඇතිකිරීම අයත් වේ. මේ අතරින් කිරි හා කුකුළු මස් ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍ර වේ. රට තුළ ලියාපදිංචි පශු සම්පත් ගොවිපළ 600,000ක් පමණ ඇති අතර ඉන් 80% කට වැඩි ප්‍රමානයක් ක්‍රියාත්මක වන්නේ අකර්මන්‍ය ශ්‍රමිකයන් යොදවා ඌන උපයෝගිතා හෝ ආන්තික ඉඩම්වලය. රට තුළ ලියාපදිංචි සත්ව ගොවිපළ 600,000ක් පමණ ඇත. තවද කිරි ගොවීන් 250,000ක් ඇතුළුව ආසන්න වශයෙන් පවුල් ඒකක 600,000ක් සෘජුවම මෙම අංශයේ නියැලී සිටිති.රට තුළ ලියාපදිංචි පශු ගොවිපලවලින් 80%කට වඩා වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වන්නේ අකර්මණ්‍ය ශ්‍රමිකයන් යොදවා ඌන උපයෝගීතා හෝ ආන්තික ඉඩම්වලය.

කිරි ගොවි කර්මාන්තය පශු සම්පත් අංශයේ ප්‍රධාන උප අංශය වේ. කිරි පරිභෝජනය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යංශයේ ආහාර පදනම් කර ගත් මාර්ගෝපදේශයන්ට අනුව වැඩි හිටියෙකුගේ දෛනික පෝෂණ අවශ්‍යතාවය සපුරාලීම සඳහා කිරි/ කිරි නිෂ්පාදන මිලි ලීටර් 150 ක් පරිභෝජනය කළ යුතුය. කෙසේවෙතත් දේශීය නිෂ්පාදන මට්ටමට අනුව , අවශ්‍යතාවයෙන් 50 %ක් පමණක් දේශීයව සපුරනු ලැබේ. ඉතිරිය ආනයනික පිටිකිරි සහ කිරි නිෂ්පාදන මගින් සැපයෙන අතර ඒ සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 50 ක් පමණ වැය වේ.

කුකුළු කර්මාන්තය සම්පූර්ණයෙන්ම මෙහෙයවනු ලබන්නේ පෞද්ගලික අංශය විසිනි. කුඩා පරිමාන කුකුල් කර්මාන්තකරුවන් සමඟ යෙදවුම් සහ වෙළෙඳාම සඳහා වූ ඉදිරි කොන්ත්‍රාත් (Forward contracts) වලට එළඹීම හරහා සිදුවේ. කුකුල් කර්මාන්තය සම්පූර්ණයෙන්ම මෙහෙයවනු ලබන්නේ පෞද්ගලික අංශය විසිනි. රාජ්‍ය මැදිහත්වීම කුකුළු සෞඛ්‍ය කළමණාකරනය , පර්යේෂණ සහ කුකුළු නිෂ්පාදනවල තත්ත්ව සහතිකය යන ක්ෂේත්‍රවලට පමණක් සීමා වේ. ගෘහස්ථ පරිභෝජන අවශ්‍යතා සපුරාලීමට මෙම අංශයට හැකියාව ඇත. දැනට රට තුළ බිත්තර සඳහා ගොවිපළ 20,896 ක්, මස් සඳහා කුකුළු ගොවිපළ 10,490 ක් සහ ගෙවතු කුකුළු ගොවිපළ 222,943 ක් ලියා පදිංචි වී ඇත.

පශු සම්පත් අංශයේ රාජ්‍ය ප්‍රතිපත්තිය වන්නේ ස්වභාවික පරිසර පද්ධතිවල තිරසාර බව සහතික කරමින්, ගෘහස්ථ ජීවනෝපාය වැඩිදියුණුකිරීම හා අපනයන සඳහා සත්ත්ව නිෂ්පාදන යොමුකිරීම සඳහා මැදිහත්වීම තුළින් සත්ත්ව නිෂ්පාදන දේශීය ආර්තිකය සඳහා ඵලදායී ලෙස

දායක කර ගැනීමයි. ඒ අනුව සත්ත්ව අභිජනනය, සත්ත්ව සෞඛ්‍ය කළමණාකරණය සහ සත්ත්ව නිෂ්පාදන අංශය සංවර්ධනය සහ තත්ත්ව නියාමනය සඳහා රජය සෘජුව මැදිහත් වේ.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි පශු සම්පත් අංශය විසින් සම්පූර්ණ කරන ලද කාර්යයන්:

- ව්‍යාපෘති යෝජනා 02 ක් ඇගයීම් සිදු කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.
- පශු සම්පත් අංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 01 ක් සඳහා අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම.

**ඉඩම් හා වාරිමාර්ග**

රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම, නව ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම සහ පවතින ජල සම්පත වැඩි දියුණු කිරීමත් සමඟ සුදුසු, සාධාරණ ජලය බෙදා හැරීම සහතික කිරීම සඳහා වාරිමාර්ග අංශය අත්‍යවශ්‍ය වේ. ජල සම්පත් සංවර්ධනය යටතේ දැනටමත් මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, උමාඔය ජල හැරවුම් ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ සංවර්ධන වැඩසටහන්වල අවසන් අදියරේ වැඩකටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරම නව ව්‍යාපෘති රැසක් කෘෂිකාර්මික හා වෙනත් ජල අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා ආරම්භ කර ඇති අතර ඒ යටතේ මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය, තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය, දේශගුණික බලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහන යන ව්‍යාපෘති ප්‍රධාන වේ. කෙසේ වෙතත්, රටේ පවතින වත්මන් මූල්‍ය තත්ත්වයත් සමඟ, මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය අවශ්‍ය විකල්ප සමඟ නැවත නිරීක්ෂණය කර ඇත. කෙසේ වෙතත්, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා එහි සෘජු දායකත්වය හේතුවෙන් එල්ලංගා සංවර්ධනය හරහා ජල සම්පත් සංවර්ධනය ප්‍රමුඛ මැදිහත්වීමක් ලෙස හඳුනාගෙන ඇත. තවද, ජලය අපතේ යෑම වැළැක්වීම සඳහා ජල ප්‍රවාහන පද්ධති වැඩිදියුණු කිරීම හෝ අවශ්‍ය පුනරුත්ථාපන කටයුතු සිදු කෙරේ. මිනිසුන්ට සහ භෝග සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා භූගත ජලය උපයෝගී කර ගැනීම සහ වැසි ජලය රැස් කිරීම ද ගවේෂණය කෙරේ.

**ඉඩම් සම්පත**

ප්‍රයෝජනයට නොගත් සහ ඌන උපයෝගිතා ඉඩම් ඵලදායී භාවිතය සඳහා ගෙන ඒම ආර්ථිකය නංවාලීමේ මූලික අවශ්‍යතාවක් ලෙස පිළිගැනේ. ඉඩම් සම්පතේ ඵලදායිතාව ඉහළ නැංවීම, තරඟකාරීත්වය සහ ආදායම වැඩි කිරීම සඳහා තීරණාත්මක සාධකයකි. එබැවින් හොඳම විකල්පය සඳහා ඉඩම් භාවිතා කිරීම අනෙකුත් යෙදවුම් අවශ්‍යතා සමඟ එක්ව ආර්ථිකය නංවාලීම සඳහා උපකාරී වේ. ඉඩම් බැංකුවේ ප්‍රවේශය ප්‍රධාන වශයෙන් ඉලක්ක කර ඇත්තේ ආර්ථිකයේ ආයෝජන සහ වර්ධනය ඉහළ නැංවීම සඳහා ය. මෙම සංකල්පය ප්‍රධාන නියෝජිතායතනය ලෙස ඉඩම් අමාත්‍යාංශය විසින් භාර ගනු ලබන අතර අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහාය ද ලැබේ. මීට අමතරව, "බිම්සවිය" වැඩසටහන පසුගිය වසර කිහිපය පුරා ක්‍රියාත්මක කර ඇති අතර ප්‍රධාන වශයෙන් ඉඩම් පරිහරණය සහ සංවර්ධනය වැඩිදියුණු කිරීමේ අදහසින් වඩාත් ශක්තිමත් සහ නිරවුල් ඉඩම් අයිතිය ලබා දීම සඳහා

මෙන්ම ඉඩම් හිමිකම හෝ සීමා මායිම් හේතුවෙන් ඇති වන අනවශ්‍ය ආරවුල් මගහරවා ගැනීම අරමුණු කර ගෙන ඇත. අවශ්‍ය පරිපාලන හා නීතිමය සංශෝධන සහිතව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සුදුසු පරිදි වේගවත් කර ඇත.

සංචාරක හා ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශ සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සලකා බලමින් නිරීක්‍ෂණයන් සැපයීම මෙම අංශයේ (Agriculture Cluster) ප්‍රධාන දායකත්වය වේ.

**විශේෂ කාර්යයන්**

- ඉඩම් හා වාරිමාර්ග අංශයවලට අදාලව ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජන 7 ක් ඇගයීමට ලක් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය සහ වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 24 ක් ඉදිරිපත් කරන ලදි.
- මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය, දේශගුණික බලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහන සහ ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණික විපර්යාසවලට කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහභාගී වීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම්වලට සහභාගි වීම.
- දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව සහය සටහන (Aide Memoire) සඳහා නිරීක්ෂණ ලබා දීම.
- ජාතික අයවැය දෙපාර්තෙමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තෙමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

## වැවිලි

වැවිලි කර්මාන්ත අංශය ශ්‍රී ලංකා ආර්ථිකයේ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. තේ, රබර් සහ පොල් ප්‍රධාන වැවිලි බෝගයන් වන අතර, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත්, උක්, බඩ ඉරිඟු සහ කහ සුලු වැවිලි බෝගයන් වේ. වැවිලි අංශය රටෙහි සමස්ත අපනයන ආදායමට දක්වන දායකත්වය සියයට 27 ක් පමණ වන අතර, වැවිලි අංශය ආශ්‍රිතව ජීවනෝපාය සළසා ගන්නා පිරිස මිලියන 1.5 ක් පමණ වේ. වැවිලි ක්ෂේත්‍රයේ නිෂ්පාදනය වැඩි කිරීම, බෝග විවිධාංගීකරණය සහ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට 2023 වර්ෂයේ කටයුතු කරන ලදී.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් වැවිලි අංශය සඳහා සිදුකළ කාර්යයන්-

- ව්‍යාපෘති වාර්තා 28 ක් විශ්ලේෂණය කර ඒ අතරින් ව්‍යාපෘති යෝජනා 06 ක් සඳහා අනුමැතිය ලබා දීම. රජය විසින් වරින් වර නිකුත් කරන ලද රාජ්‍ය වියදම් සීමා කිරීමේ චක්‍රලේඛ වලට යටත්ව නව ව්‍යාපෘති පිළිබඳ අනුමැතිව පසුව ලබා දීමේ පදනම මත හදිසි සහ ප්‍රමුඛ ව්‍යාපෘති සඳහා පමණක් ඉහත අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලදී.

- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 04 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

**විශේෂ ක්‍රියාකාරකම්**

- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ජයිකා ආයතනය විසින් සංවිධානය කළ ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ පුහුනු අවස්ථා ලබා දීම
- කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ අධීක්ෂණ කමිටු රැස්වීම් සංවිධානය කිරීම
- කුඩා වතු (තේ/රබර්) හිමියන් සඳහාවූ පුනර්ජීවන (STaRR) ව්‍යාපෘතියේ හා කෘෂිකර්ම අංශය නවීකරණ ව්‍යාපෘතියේ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම.
- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාර්ග සිතියම සකස් කිරීම සඳහා සහයෝගය ලබා දීම
- කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාර්ග සිතියම සකස් කිරීම සඳහා සහයෝගය ලබා දීම

## ධීවර

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට උපයෝගී කර ගත හැකි විශාල ජලජ සම්පත් හා ඒ ආශ්‍රිත අවස්ථාවන් ශ්‍රී ලංකාව සතුව පවතී. ධීවර අංශය මගින් මිලියන 2.8 ක පමණ ජනතාවකට ඍජු හා වක්‍ර රැකියා අවස්ථා ලබා දෙයි. ධීවර අංශය දළ දේශීය නිෂ්පාදනයට දරණ දායකත්වය සියයට 1.1 ක් පමණ වේ. මධ්‍යකාලීන අයවැය රාමුව තුල ධීවර නිෂ්පාදන මගින් ස්වයංපෝෂිත කිරීම මගින් ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම හා අපනයන තත්වයන් ඉහල නංවාලීම ඉලක්ක කරගත් වැඩපිළිවෙලක් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව, ධීවර වරාය සහ නැංගුරම් පොළ සංවර්ධනය කිරීම, නවීන තාක්ෂණය හඳුන්වාදීම, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීම, ජල ජීවී වගා නිෂ්පාදනය ඉහළ නැංවීම, පර්යේෂණ හා සංවරධන කටයුතු වැඩි දියුණු කිරීම හා ධීවර ප්‍රජාව සවිබල ගැන්වීම යන ක්ෂේත්‍ර සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් ධීවර අංශය සඳහා සිදුකළ කාර්යයන්-

- ව්‍යාපෘති වාර්තා 11 ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ලබාදීම
- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 01 ක් සඳහා නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලය වෙත ලබාදීම සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 02 ක් සඳහා නිරීක්ෂණ අදාළ දෙපාර්තමේන්තු වෙත ලබාදීම

විශේෂ ක්‍රියාකාරකම්

- ධීවර අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා ජයිකා ආයතනය විසින් සංවිධානය කළ ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ පුහුනු අවස්ථා ලබා දීම
- ජනාධිපති ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් පිහිටුවන ලද ඉහල බලපෑමක් ඇති ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහාවූ විශේෂඥ කමිටුවට සහභාගීවීම.

## 2.3 කර්මාන්ත, වෙළෙඳ, ආයෝජන සහ සංචාරක

### කර්මාන්ත, වෙළඳ සහ ආයෝජන ප්‍රවර්ධන

දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා කාර්මික නිෂ්පාදන ශ්‍රී ලංකාවේ නිමැවුම් ආර්ථිකයේ ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට කර්මාන්ත අංශයේ දායකත්වය 30%ක් පමණ වන අතර අපනයන ආදායමෙන් 80%ක් ජනනය වන්නේ කාර්මික අපනයන මගිනි. අපනයන සහ ආනයන ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ ප්‍රධාන කොටස් දෙකක් වන බැවින් හා ශ්‍රී ලාංකික ගෘහයක කැලරි පරිභෝජනයෙන් 22% ක් පමණ ආනයනික ආහාර ද්‍රව්‍ය මගින් ලබා ගන්නා හෙයින්, වෙළඳ අංශයේ ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාමාර්ග දැඩි ලෙස ගෘහස්ථ පාරිභෝගික සුභසාධනය සහතික කිරීම පමණක් නොව රට තුළ විදේශ සංචිතවල තිරසාර කළමනාකරණය සඳහාද බලපායි.. එමෙන්ම, වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදී ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ අභියෝගාත්මක මාවතට යොමු වී ඇති පසුබිමක රජයේ ප්‍රමුඛතාවය තිරසාර විදේශ ආයෝජන සහ අපනයන ප්‍රවර්ධනය වෙත යොමුවී ඇත. ඒ අනුව, සාමාජීය හා කාර්මික ක්ෂේත්‍රවල පරිවර්තනයක් තුළින් ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට නම් ඒ සඳහා අවශ්‍ය ආයෝජනයන් ඍජු විදේශ ආයෝජන මඟින් සපුරා ගැනීම ඉතා වැදගත් වේ.

මෙම අංශය වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතුවලින් සමන්විත වේ. ඒ අනුව, කර්මාන්ත, වෙළඳාම සහ ආයෝජන ප්‍රවර්ධනය සඳහා සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීම සහ ජාතික ප්‍රතිපත්ති ඉලක්ක සහ SDG ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් 2023 දී සම්පූර්ණ කල ක්‍රියාකාරකම් පහත පරිදි වේ .

- ව්‍යාපෘති යෝජනා 30ක් ඇගයීම් කරන ලදී .
- කැබිනට් සංදේශ 10 සඳහා අදහස් හා නිරීක්ෂණ ලබා දෙන ලදී.
- ප්‍රතිපත්ති පත්‍රිකා 02ක් සමාලෝචනය කර අදාළ පාර්ශ්ව වෙත අදහස් ඉදිරිපත් කරන ලදී .
- විදේශ දූත මණ්ඩල 02 කට පහසුකම් සපයන ලද අතර එම යෝජනා පත්‍ර සඳහා අදහස්, යෙදවුම් සහ නිරීක්ෂණ ලබා දෙන ලදී.

### සංචාරක

සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකා ආර්ථිකයේ විදේශ විනිමය උපයන සහ පහසුවෙන් දියුණු කළ හැකි වැදගත් අංශයක් ලෙස "වර්ෂ 2048 වන විට පූර්ණ සංවර්ධිත රටක්" යන දැක්ම සහිත සංවර්ධන න්‍යාය පත්‍රය තුළ හඳුනාගෙන ඇත. සංචාරක ව්‍යාපාරය ස්වභාවික පරිසරය හා සොබා සෞන්දර්ය මත පදනම් වූ සහ දේශීය සංස්කෘතියට හිතකර කර්මාන්තයක් ලෙස පුළුල් ජනතා සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීම රජයේ ප්‍රතිපත්තිය වේ. ඒ අනුව, 2023 වසරේ විදේශ සංචාරකයින්ගේ පැමිණීමේ පැහැදිලි වර්ධනයක් ඇති කරමින් විදේශ සංචාරකයින් අතර ශ්‍රී ලංකාව දකුණු අසියානු කලාපය තුළ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට සංචාරක අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන විසින් අවශ්‍ය පියවර ගනිමින් සිටි.

සංචාරක අංශය, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබාදීම

හා ජාතික/ආංශිත සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා දායකත්වය ලබා දේ. ඒ අනුව සංචාරක අංශය 2023 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු අවසන් කරන ලදි.

- සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 08ක් සඳහා නිරීක්ෂණ සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙනුවෙන් නිරීක්ෂණ ලබාදෙන ලදි.
- ව්‍යාපෘති යෝජනා 02ක් ඇගයීමට කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- කෙටුම්පත් කරන ලද ජාතික සංචාරක ප්‍රතිපත්තියට අදහස් සහ නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී..
- පින්නවල - කිතුල්ගල සංචාරක කොරිඩෝව සංවර්ධනය සඳහා අයවැය යෝජනාවක් සකස් කරන ලදි.
- ආශ්‍රිත සහායක සංචාරක ඔරොත්තු දීමේ ක්‍රියාකාරකම් සඳහාවූ යෝජිත සංචාරක අංශ සංවර්ධනය සහ උපදේශන ආසියානු සංවර්ධන බැංකු මෙහෙයුමට (Mission) ආරම්භක රැස්වීමක් සංවිධානය කරන ලදී.

## 2.4 වාණිජ යටිතල පහසුකම්

### ප්‍රවාහන, මාර්ග, වරාය හා ගුවන් සේවා

2024 වර්ෂය සඳහා වෙන් කරන ලද ජාතික අයවැය ප්‍රතිපාදන මත පදනම්ව, රට තුල පවතින මූල්‍ය හා ආර්ථික තත්වයද සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘති ප්‍රමුඛතාගත කරන ලද අතර, එහිදී නව මාර්ග ඉදිකිරීමට වඩා පවතින මාර්ග පද්ධතිය නඩත්තු කර පවත්වාගෙන යාමට අවධානය යොමු කරන ලදී. තවද නවීකරණය තුළින් පොදු ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම, වාහන තදබදය අවම කිරීම, මාර්ග අනතුරු අවම කිරිම, පරිසර හිතකාමී විද්‍යුත් ප්‍රවාහනය ප්‍රචලිත කිරීම, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම සඳහාද ව්‍යාපෘති තෝරාගනිමින් ඒවා ඇගයීම සාර්ථකව සිදු කරන ලදී.

**විශේෂිත වූ කාර්යයන්**

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද නව ව්‍යාපෘති හා වැඩසටහන් 09 ක් ඇගයීම.
- ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය හෝ මෙම අංශවලට අදාළව ඕනෑම අමාත්‍යාංශයක් විසින් ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශ හා ප්‍රතිපත්ති පත්‍රිකා පිළිබඳ නිරීක්ෂණ 75ක් සකස් කිරීම.
- ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීමේදී අදාළ රේඛීය අමාත්‍යාංශවලට තාක්ෂණික යෙදවුම් ලබා දීම.
- ශ්‍රී ලංකා ජාතික නාවික ප්‍රතිපත්තිය හා ශ්‍රී ලංකා තිරසාර ගුවන් සේවා පාරිසරික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- පහත සඳහන් කමිටුවල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
  - ශ්‍රී ලංකාවේ ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් කිරීම.
  - ශ්‍රී ලංකාව තුල විද්‍යුත් රථ වාහන ප්‍රචලිත කිරීමේ පසුබිම සැකසීම සඳහා විද්‍යුත් සංචරණ (e-Mobility) ප්‍රතිපත්තියක් පිළියෙල කිරීම
  - ව්‍යාපෘති මෙහෙයුම් කමිටු.

- රාජ්‍ය ආයෝජන වැඩසටහන සහ දෙපාර්තමේන්තුව විසින් වරින් වර සකස් කරනු ලබන අනෙකුත් වාර්තා සඳහා අවශ්‍ය දත්ත හා තාක්ෂණික තොරතුරු ලබා දීම.
- විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් සඳහා නිරීක්ෂණ ලබා දීම.

## විදුලිබල හා බලශක්ති

විදුලිබල හා බලශක්ති අංශය විදුලිබල සහ ඛනිජ තෙල් කර්මාන්ත නියෝජනය කරයි. 2022 වසරේ බොර තෙල් සහ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා, රු. බිලියන 1,451 වැය කරනු ලැබේ. දැනට පවත්නා මුළු විදුලි උත්පාදනය සහ රටේ ස්ථාපිත ධාරිතාව පිළිවෙලින් ගිගාවොට් පැය 15,942 සහ මෙගාවොට් 4,084 කි. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල විදුලි පරිභෝජනය සැලකීමේදී එය කිලෝවොට් 655 kW/h වන අතර, රටේ වාර්ෂික විදුලි ඉල්ලුම 5.5% ක ප්‍රතිශතයකින් ඉහළ යනු ලැබේ.

ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මගින් විදුලි උත්පාදන දිරි ගන්නවන අතර එය විදුලි ජනන මිශ්‍රණයට ඒකාබද්ධ කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. තවද රටෙහි ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගතව, විදුලි ජනන මිශ්‍රණය සඳහා පිවිතුරු බලශක්තිය එක්කිරීමට විශේෂ අවධානය යොමුකර ඇති අතර, එය රටට අවේනික, අඩු වියදම් සහිත, විශ්වසනීය ක්‍රමෝපායයන් හරහා සිදු කර ගත යුතු වේ. එබැවින් බලශක්ති හා බලශක්ති ක්ෂේත්‍රයේ වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත

ඒ අනුව 2023 වර්ෂය ඇතුලත ජාතික ක්‍රම සම්පාදන දෙපර්තමන්තුවේ දායකත්වය පහත පරිදි වේ.

- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘති යෝජනා 21 ක් ඇගයීමට ලක් කර නිරීක්ෂණ ලබා දී ඇත.
- කැබිනට් සංදේශ 12ක් සඳහා නිරීක්ෂණ ලබාදී ඇත.
- පුනර්ජනනීය විදුලි බල හා බලශක්ති යෝජනා ආදි ආයෝජන යෝජනා වලට නිරීක්ෂණ හා අදහස් ලබාදී ඇත.
- විදේශ දූත මණ්ඩලවලට අදාළ කරුණු පිළිබඳව නිරීක්ෂණ ලබා දීම.
- අදාල ආයතන සම්බන්ධ කර ගනිමින්, වහල මත සූර්ය පැනල ආශිතව පවතින අභියෝග විශ්ලේෂණය කිරීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකා බැටරි බලශක්ති සංචිත පද්ධති ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශයන්හි ප්‍රවිණයන්ගෙන් සැදුමලත් කමිටුවක් ස්ථාපිත කරන ලදි. එ් අනුව තාක්ෂණික උපකමිටු 3 ක් ස්ථාපනය කල අතර පසුගිය වසරේ රුස්වීම් වාර 3 ක් පවත්වන ලදි.

## පානීය ජලය සහ සනීපාරක්ෂක

පානීය ජල හා සනීපාරක්ෂක අංශය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුව මඟින් ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශය යටතේ, සේවා සැපයීම් වැඩිදියුණු කිරීම් සහ ජලය සැපයීමේ ආවරණ කලාප වැඩිදියුණු කිරීම් තුළින් රට තුළ සුරක්ෂිත පානීය ජලය සැපයුම ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූලික

නිර්දේශය ඇතිව 2023 වර්ෂය තුළ විවිධ පරිමාණයෙන් යුතු පානීය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

2023 වර්ෂයේදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් ඇගයීම් කරන ලද ව්‍යාපෘති හතක් (07) ක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කරන ලදී. එසේම NPD විසින් ක්ෂේත්‍රයේ විවිධ ගැටළුවලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ 25ක් සඳහා නිරීක්ෂණ ,අදහස් සහ සටහන් ලෙස අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කොට ඇත. ඒ අනුව ,ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ජල හා සනීපාරක්ෂක අංශයේ විවිධ කටයුතු සඳහා පූර්ණ සහයෝගීතාව ලබා දුන්නේය. තවද, 2023 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජල සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය අවසන් කිරීමට NPD මගින් පූර්ණ සහාය ලබා දුන්නේය. පාරිභෝගික සම්බන්ධතා සඳහා නව මාර්ගෝපදේශය, ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍ර ට අදාල පානීය ජලය පිළිබඳ ප්‍රතිපත්තිය සහ ජල ආරක්ෂණ සැලැස්ම පිළිබඳ ප්‍රතිපත්තිය වැනි ජල හා සනීපාරක්ෂක අංශයේ කටයුතු සඳහා විශේෂිත දැනුම ලබා දෙමින් දායකත්වය සපයන ලදී.

**නාගරික සංවර්ධන සහ නිවාස**

නාගරික ප්‍රදේශ සංවර්ධනය රටක සංවර්ධනය සඳහා ඉතා වැදගත් අතර එය රටක ශ්‍රී විභූතිය පෙන්වන ප්‍රධාන සාධකයක් වේ. නාගරික ප්‍රදේශවල පහසුකම් සංවර්ධනය සඳහා රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. අඩු අදායම්ලාභී නිවාස සහ මධ්‍යම අදායම්ලාභී නිවාසද ඇතුලත්ව නාගරික ප්‍රජාව ඉලක්ක කරගත් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, තෝරාගත් පසුගාමී නගරවල පොදු පහසුකම් සංවර්ධනය, නගරාශ්‍රිත ජලාපවාහන පහසුකම් වැඩිදියුණු කිරීම සහ ගංවතුර පාලනය, සංචාරක සංවර්ධනය ඉලක්ක කොට තෝරාගත් ප්‍රදේශවල නාගරික පහසුකම් සංවර්ධනය, ඝන අපද්‍රව්‍ය කළමණාකරණය, බස් නැවතුම්පොළ, පොදු වෙළෙඳපොළ, රථගාල් වැනි පහසුකම් සංවර්ධනය ආදිය ඉතා වැදගත් වේ.

කෙසේ වුවද, රටතුළ පැවති ආර්ථික අර්බුදය හමුවේ 2023 වසර තුළ සැලසුම් කල පරිදි නාගරික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අභියෝගයක් විය. අමුද්‍රව්‍ය මිල ඉහල යාම හේතුවෙන් ඉදිකිරීම් පිරිවැය ඉහල යාම, අමුද්‍රව්‍ය හිඟකම, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද වීම, සමහර විදේශ ආධාරක ආයතන මගින් බලාපොරොත්තු වූ ණය ආධාර නොලැබී යාම, රාජ්‍ය ආයෝජන සීමා කිරීම ආදිය මෙයට හේතු විය.

විශේෂයෙන්ම, නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රය සැලකූ විට, 2019 වර්ෂයේ සිට බලපැවැත්වූ කොරෝනා වසංගත තත්ත්වයේ ඍජු බලපෑම හේතුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍යය මිළ දැඩි ලෙස ඉහළ යාම, ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා යොදා ගැනෙන අමුද්‍රව්‍යය හා අන්තර් භාණ්ඩ ආනයනය සීමා වීම, විදේශ විනිමය ගැටලුව හා ජනතාවගේ ජීවන මට්ටම පහළ යාම හේතුවෙන් නිවාස ඉදිකිරීම් අංශය ආර්ථික පසුබෑමත් සමඟ 2022 වසරට සාපේක්ෂව 2023 වර්ෂය තුළ දී මන්දගාමී වර්ධනයක් පෙන්වා ඇත. එසේවුවත්, මෙම වසර තුළ දී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ අඩු ආදායම්ලාභීන් හා මධ්‍යම පාන්තිකයන් සඳහා ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති හා විදේශ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති වල ඉදිකිරීම් අඛණ්ඩව සිදු වූ අතර ඉන්දීය රජය යටතේ ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති මෙහිදී ප්‍රමුඛත්වය ගෙන ඇත. මීට අමතරව, අයවැය යෝජනාවක් ලෙස ආරම්භ කරන ලද ගොඩනැගිලි සඳහා කේත ක්‍රමයක් (Building Codes)

හඳුන්වා දීමේ ව්‍යාපෘතිය ලෝක බැංකු තාක්ෂණික සහාය යටතේ මෙම වසර තුළ දී සාර්ථක ලෙස අවසාන අදියර කරා ළඟා වීමට හැකි විය.

**ක්‍රියාකාරකම්**

- අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 11 ක් සඳහා නිරීක්ෂණ සැපයීම
- නාගරික සංවර්ධනය හා නිවාස සම්බන්ධ ව්‍යාපෘති යෝජනා 20ක් ඇගයීමට ලක් කර ඒ පිළිබඳ නිරීක්ෂණ සහිතව අවශ්‍යය කටයුතු සඳහා යොමු කිරීම
- ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල වපසරියේ සිදු කරනු ලබන වෙනස්කම් සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම
- රාජ්‍ය ආයෝජන වැඩසටහන යාවත්කාලීන කිරීම
- ව්‍යාපෘති මෙහෙයුම් කමිටු / ප්‍රගති සමාලෝජන කමිටු වලට සහභාගී වීම
- විදේශ ආධාර ලබාදෙන ආයතන මගින් මුල්‍යනය සිදු කරන ව්‍යාපෘති සම්බන්ධයෙන් එම ආයතන සමඟ අදාළ පරිදි කටයුතු කිරීම
- ව්‍යාපෘති /ආංශික සංවර්ධනය සම්බන්ධයෙන් වාර්තා සකස් කිරීම
- ජාතික සහ ආංශික ප්‍රතිපත්ති සකස්කිරීමට දායකවීම
- ව්‍යාපෘති හා අංශයට අදාළ වන වාර්තා සකස් කිරීම
- නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සහ අදාළ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම
- මෙම අංශයේ සංවර්ධනය හා සැලසුම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සහ අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම

## 2.5 යහපාලන

2023 වර්ෂයේ දී රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම උදෙසා ද රට තුළ සාමකාමී පරිසරයක් ඇති කිරීම සඳහා ද නීතිය ක්‍රියාත්මක වන සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම සඳහා ද රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව වැදගත් කාර්යභාරයක් යහ පාලන අංශය විසින් ඉටු කොට ඇත.

යහ පාලන අංශය වෙත ලැබෙන ව්‍යාපෘති යෝජනා ඇගයීම සහ එම අංශය වෙත ලැබෙන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම මෙන්ම, රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව හා තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම අරමුණු කොට ගනිමින් මධ්‍යකාලීන ආයෝජන වැඩසටහන සකස් කිරීම මෙම අංශය විසින් ඉටුකොට ඇත. තවද නව තාක්ෂණය හා සබැඳි රාජ්‍ය සේවයක් ගොඩනැගීම, මිත්‍රශීලි නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, ප්‍රජාතන්ත්‍රවදය හා සමානාත්මතාව සුරැකීම, වංචාවෙන් හා දූෂණයෙන් තොර රටක් බිහි කිරීම, හා රාජ්‍ය සේවය තුළ වගවීම හා විනිවිද භාවය තහවුරු කිරීම අරමුණු කොට පහත සඳහන් අමාත්‍යාංශ හා අනෙකුත් ආයතනවලට අදාල ක්ෂේත්‍රයන්හි ක්‍රමසම්පාදන ක්‍රියාවලියට සක්‍රීයව දායකවී ඇත.

- රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන
- මහජන ආරක්ෂාව
- ජාතික ආරක්ෂාව
- ජන මාධ්‍ය

- අධිකරණ
- විදේශ කටයුතු
- ආගමික, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන්
- ස්වාධීන කොමිෂන් සභා හා විශේෂ වියදම් ඒකක

ඒ අනුව, කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය කළමනාකරණයක් උදෙසා යහ පාලන අංශය යටතේ 2023 වර්ෂයේදී,

- රජයේ අරමුදල් හෝ විදේශ අරමුදල් මඟින් මූල්‍යයන කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා 48 ඇගයීමට ලක් කිරීම.
- විවිධ අමාත්‍යාංශ යටතේ ඉදිරිපත් වූ අමාත්‍ය මණ්ඩල සංදේශ 41 සඳහා නිරීක්ෂණ හා විචාර ලබා දීම.
- අංශයේ විෂය පථය යටතේ මෙහෙයුම් කමිටු ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ව්‍යාපෘති පිළිබඳ වැඩිදුර සාකච්ඡා කිරීම සහ සහභාගී වීම.
- ආර්ථික සංවර්ධනය සඳහා හිතෛෂී පරිසරයක් සකස්කිරීම හා කාර්යක්ෂම මහජන සේවයක් තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මකවන ව්‍යාපෘති මෙහෙයුම් කමිටු 09 සඳහා දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය නියෝජනය කරමින් එම රැස්වීම් වලට සහභාගි වීම.

**සාර්ව ආර්ථික**

මෙම දෙපාර්තමේන්තුවේ සාර්ව ආර්ථික අංශය යනු සියලුම සංවර්ධන අංශ සාර්ව ප්‍රතිපත්ති රාමුවකට ඒකාබද්ධ කරන අංශයයි. මෙම අංශය පොදු සංවර්ධන ඉලක්ක සකස් කිරීම සඳහා සංවර්ධනයේ අනෙකුත් අංශවලට ද මග පෙන්වයි. මෙම අංශය දේශීය හා විදේශීය ආර්ථිකයන් අධ්‍යයනය කරන අතර දේශීය ආර්ථිකයේ ඇති අවස්ථා සහ අභියෝග හඳුනාගෙන පවතින සීමිත සම්පත් වඩා ඵලදායී සංවර්ධන කටයුතු වෙත යොමු කරවීමට මග පෙන්වයි. මීට අමතරව, රාජ්‍ය ආයෝජන කළමනාකරණය කිරීමේ අරමුණින් දැනට පවතින මූල්‍ය සම්පත් ජාතික ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා වෙන් කිරීම සඳහා මෙම අංශය විසින් 2023 – 2025 රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) සකස් කරන ලදී. ඒ අනුව සාර්ව ආර්ථික අංශය මගින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

ආර්ථිකයේ ඇති අවස්ථා සහ අභියෝග හඳුනාගෙන පවතින සීමිත සම්පත් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ලෙස යොමු කිරීමට නිර්දේශ ලබා දේ.

රාජ්‍ය ආයෝජන සැලැස්මේ 2023-2025 හි අදාළ පරිච්ඡේදය සකස් කිරීම සඳහා ඒ ඒ අංශවලට මඟ පෙන්වීම.

- රාජ්‍ය ආයෝජන සැලැස්මේ 2023-2025 සම්පාදනය කර එය ජාතික විමර්ශන ලේඛනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.
- සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සහ ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති අවස්ථා සහ අභියෝග හඳුනා ගැනීම.
- රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය, මුදල්, ආර්ථික ස්ථායීකරණ අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන සහ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා යෝජිත ප්‍රතිපත්ති පදනම් කරගත් ණය වැඩසටහන සඳහා නිරීක්ෂණ සහ අදහස් දැක්වීම.

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත, රාජ්‍ය ණය කළමනාකරණ පනත සහ ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය  පිළිබඳ චක්‍රලේඛය කෙටුම්පත් කිරීමට සහය වීම.
- ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සම්බන්ධීකරණය කිරීම
- සාර්ව ආර්ථික පුරෝකථනය පිළිබඳව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ  ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් පවත්වන ලදී.

## 2.6 පරිසර කළමනාකරණය

නියමිත ආයෝජනයන් සිදු කරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට පහසුකම් සපසන අතරතුර පාරිසරික ගුණාත්මක බව තහවුරු කරමින් තිරසාර සංවර්ධනයක් කෙරෙහි යොමු වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම පරිසර කළමනාකරණය තුළින් බලාපොරොත්තු වේ. දූෂණයෙන් තොර පරිසරයක් හා වස-විසෙන් තොර ආහාර රටාවක් තහවුරු කිරීම සඳහා පරිසර ප්‍රතිපත්තිය තුළ හරිත සංවර්ධනය යන සංකල්පය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

පරිසර කළමනාකරණයේ විෂය පථයට පරිසර දූෂණය පාලනය කිරීම, කසළ කළමනාකරණය, වනාන්තර සංරක්ෂණය, තිරසාර ඉඩම් කළමනාකරණය, මිනිස් - වනජීවී සහ පැවැත්ම, ජීවී සම්පත් සංරක්ෂණය සහ ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය ආදිය අතුළත් වේ.

අවම කාබන් පරිහරණයකින් යුතු පිරිසිදු හරිත පරිසරයක් ළඟා කර ගැනීම, පරිසර දූෂණය අවම කිරීම, ඉහළ ජෛවවිවිධත්වය සහ පරිසර පද්ධති සේවා, පාරිසරික අවදානම අඩු කිරීම කාර්යක්ෂම සහ තිරසාර සම්පත් පරිභෝජනය තුළින් ජීවන තත්ත්වය උසස් කිරීම, පාරිසරික ගුණාත්මක බව ඉහළ නැංවීම සහ සුවාභාවික උපද්‍රවයන්ගේ බලපෑම් අවම කිරීම යන කරුණු කෙරෙහි පරිසර කළමනාකරණ අංශයේ අවධානය යොමු වී ඇත. තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මනා පරිසර කළමනාකරණය ඉතාමත් වැදගත් අවශ්‍යතාවයක් වේ. එබැවින් සංවර්ධන සැලසුම්කරණයේදී පාරිසරික සමතුලිතතාවය පවක්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන ජෛවවිවිධත්වය සංරක්ෂණය හා පරිසර පද්ධති පිළිබඳ නිසි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

### ඉටු කරන ලද කාර්යයන් / විශේෂ අවස්ථා

- පරිසර කළමනාකරණ අංශයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 17 ක් ඇගයීමට ලක් කිරීම.
- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 18 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිය විශ්ලේෂණය කොට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- පරිසර සම්පත්වල අගය ගණනය කිරීම සඳහා මාර්ගෝපදේශය - (Green Book) සැකසීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ කටයුතු ආරම්භ කිරීම.
- සමුද්‍රීය අවකාශ සැලසුම්කරණය (Maritime Spatial Planning) වැඩසටහන සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ජනාධිපති කාර්යාලයේ විශේෂ දේශගුණික විපර්යාස කාර්යාලය, සමඟ එක්ව මූලික කටයුතු ආරම්භ කිරීම.

- ශ්‍රී ලංකාව සඳහා හරිත බැඳුම්කර රාමුව (Green Bond Framework for Sri Lanka) වැඩසටහන සඳහා අවශ්‍ය නිර්දේශ සැපයීම.
- කාබන් ශුද්ධ ශුන්‍ය මාර්ග සිතියම සහ ශ්‍රී ලංකාව සඳහා උපාය මාර්ගික සැලැස්ම (Carbon Net Zero Road Map and Strategic Plan) ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනවල තාක්ෂණික ධාරිතාව ගොඩනැගීම පිළිබඳ වැඩසටහන සඳහා අදහස් ලබා දීම.
- දේශගුණික මූල්‍ය ජාලය (Climate Finance Network ) ව්‍යාපෘතිය යටතේ දේශගුණ අයවැය ටැග් කිරීම (Climate Budget Tagging) වැඩසටහන සඳහා නිර්දේශ හා නිරීක්ෂණ සැපයීම.
- ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) විසින් පවත්වනු ලබන Work plan and way forward of climate smart Governance Dashboard වැඩසටහන සඳහා විස්තර/ආදාන සැපයීම.
- පරිසර කළමනාකරණ අංශයේ ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම.
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම.
- පරිසර අංශයට සම්බන්ධ විවිධ මෙහෙයුම් කමිටු සඳහා සහභාගී වීම
- විදේශ දූත මණ්ඩල සම්බන්ධ කරුණු සඳහා නිරීක්ෂණ ලබා දීම

**අපදා කළමනාකරණය**

ආපදාවකට මුහුණ දීම සඳහා සම්පත් සංවිධානය කිරීම හා මෙහෙයවීම ලෙස ආපදා කළමනාකරණය හැඳින්විය හැකිය. තවද, එයට අදාල වගකීම අපදා සඳහා මුහුණ දෙන්නන්, පෞද්ගලික අංශයේ සංවිධාන, රාජ්‍ය අංශයේ ආයතන, ස්වේච්ඡා සේවකයන්, පරිත්‍යාගශීලීන්ගේ යන සියලු දෙනාගේ භූමිකාවන් හා වගකීම වන අතර මනා සම්බන්ධීකරණයෙන් සිදු කල යුතුවේ . ආපදා කළමනාකරණයේ මූලික අරමුණ වනුයේ ඊට අදාලව සූදානම වීම , ප්‍රතිචාර දැක්වීම, නැවත යතා තත්වයට පත් වීම සහ අවම කිරීමට තුළින් ඇති වන බලපෑම් අවම කිරීමයි.

වර්තමාන සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන “සෞභාග්‍යයේ දැක්ම ” ට අනුකූලව ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මට ආපදා අවදානම් අඩු කිරීමෙහි ඇති වැදගත්කම අවධාරණය කරන අතර ආයතනික සංවර්ධනය, බහු උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති වැනි අංශයන් යටතේ අපදා කළමනාකරණය සඳහා අවශ්‍ය පියවර මේ වන විටත් ගෙන ඇත. එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජය විසින් දළ වශයෙන් රුපියල් බිලියන 4 කට අසන්න ප්‍රමාණයක් වාර්ෂිකව වැය කරනු ලැබේ .

තවද, සෙන්දායි රාමුව වැනි ජාත්‍යන්තර වගකීම් වලට අනුකූලව, ආපදා අවදානම වටහා ගැනීම, ආපදා අවදානම් පාලනය ශක්තිමත් කිරීම තුළින් ස්වභාව ධර්මය හෝ මිනිසා විසින් ඇති කරන ලද හෝ පාරිසරික, තාක්‍ෂණික හා ජීව විද්‍යාත්මක ගැටලු හේතුවෙන් ඇති වන අවදානම් සෑම ආකාරයකින්ම අඩු කිරීමට අපේක්‍ෂා කරන අතර ඒ හරහා ආපදා අවදානම අඩු කිරීම සඳහා ආයෝජනය කිරීම, ඵලදායි ප්‍රතිචාර දැක්වීම සඳහා ආපදා සූදානම වර්ධනය කිරීම සහ ප්‍රතිසාධනය, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණය කිරීමට ආපෙක්ෂා කෙරේ.

**විශේෂ අවස්ථා**

- ආපදා කළමනාකරණ අංශයට අදාළව ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 03 ක් ඇගයීමට ලක් කිරීම.

- ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියේ (Project submission format)14 වන කොටස (ආපදා අවදානම අවම කිරීම) සඳහා මාර්ගෝපදේශ අත්පොත සකස් කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) සමඟ එක්ව කටයුතු කිරීම.
  - ආපදා කළමනාකරණ අංශයේ ව්‍යාපෘතීන් ප්‍රමුඛතාවය අනුව පෙළ ගැස්වීම.
  - ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම.
  - ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ නියෝජිතායතනවලට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
  - විදේශ දූතමණ්ඩල සම්බන්ධ කරුණු සඳහා නිරීක්ෂණ ලබා දීම.

## 2.7 සමාජ ආරක්ෂණ

**සමාජ ආරක්ෂණ**

සමාජයේ ජීවත්වන වන වරප්‍රසාද නොලත් අත්‍යවශ්‍ය සියලුම ජන කොටස් සඳහා ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවමින් සහ සවිබල ගැන්වීම් මඟින් රටේ සංවර්ධන ප්‍රවේශයට අනුගත කිරීම සඳහා ඉලක්ක කර ගත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම රැසක් රජය ක්‍රියාත්මක කරනු ලබයි. කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය ළමයි, අවාසි සහගත කාන්තාවන්, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයින් ඇතුළුව අවදානමට ලක්විය හැකි කොටස් වල යහපැවැත්ම සහතික කිරීම සඳහා වගකිව යුතු ප්‍රධාන අමාත්‍යාංශ වේ. ඒ අනුව මෙම කණ්ඩායම්වල ජීවන තත්ත්වය නඟා සිටුවීමට සහ ඔවුන් සමාජයට ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව රේඛීය අමාත්‍යාංශ සමඟ අවශ්‍ය මැදිහත්වීම් සිදු කරයි.

**2023.12.31 දිනට ප්‍රගතිය**

- ව්‍යාපෘති යෝජනා සඳහා ඇගයුම් වාර්තා සකස් කිරීම සහ කැබිනට් පත්‍රිකා වෙත නිරීක්ෂණ සකස් කිරීම

| | ලැබුණු සංඛ්‍යාව | නිර්දේශිත/ ඉදිරිපත් කළ සංඛ්‍යාව |
|---|---|---|
| ව්‍යාපෘති යෝජනා | 04 | 04 |
| කැබිනට් සංදේශය සඳහා නිරීක්ෂණ | 03 | 03 |
| කැබිනට් සංදේශය සඳහා අදහස් | 04 | 04 |

- **ප්‍රතිපත්ති සමාලෝචනය සහ ඇගයීම - පහත ප්‍රතිපත්ති සමාලෝචනය කර නිරීක්ෂණ ලබා දෙන ලදී;**
  - ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

– ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

- **ජාතික ප්‍රතිපත්ති සැකසීම -** ශ්‍රී ලංකාව සඳහා ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සටහන කෙටුම්පත් කරමින් පවතී.
- **පහත වාර්තා පිළිබඳ අදහස් ලබා දෙන ලදී;**

  – 2023, UPR හි 4 වන චක්‍රය

  – කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW)

  – විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවට පහසුකම් සැලසීම සඳහා වන ජාතික වැඩසටහන

  – දකුණු ආසියානු ක්‍රියාකාරකම් වලදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමාජ සහභාගීත්වය වැඩි දියුණු කිරීම

  – ශ්‍රී ලංකාව: මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය (P 151916), ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීම සහ ප්‍රතිඵල වාර්තාව

  – ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ තත්ත්වය

  – ආසියාවේ සහ පැසිෆික් කලාපයේ පුළුල් සහ ඔරොත්තු දෙන සමාජ ආරක්ෂණ පද්ධතියක් සංවර්ධනය කිරීම
- **රැස්වීම් සහ වැඩමුළු වලදී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව නියෝජනය කරයි**

– සමාජ ආරක්ෂණ අංශයේ අදාළ රේඛීය ආයතන විසින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම්වලට සහභාගී වූ අතර සමාජ ආරක්ෂණ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය යෙදවුම් සපයන ලදී.

**ශ්‍රමික**

භාණ්ඩයක් හෝ සේවාවක් වෙළඳපොළට ගෙන ඒම සඳහා පුද්ගලයෙකු විසින් කායික හා මානසික වශයෙන් දරන උත්සාහය නොහොත් ශ්‍රමය, නිෂ්පාදනයේ ඉතාම වැදගත් සාධකයක් වේ. ශ්‍රමය පිළිබඳ සැලකීමේදී, පුද්ගලයාගේ කුසලතා මට්ටම, අධ්‍යාපනය සහ ඵලදායිතාව කෙරෙහි ඇති උනන්දුව ඇඳහිය නොහැකි තරම් වැදගත් අංග වේ. එබැවින් ආර්ථිකයේ සමස්ත ඵලදායිතාව ශ්‍රමයේ ගුනාත්මකභාවය මත රදා පවතී. "ජාතික පරිවර්තන මාර්ග සිතියම (National Transformation Road Map)" අනුව 2048 වන විට ශ්‍රී ලංකාව සමෘද්ධිමත් ජාතියක් ලෙස සංවර්ධනය කිරීමට අරමුණු කරන බැවින් කුසලතාවෙන් හෙබි ඵලදායි ශ්‍රම බළකායක් බිහිකිරීම අත්‍යවශ්‍ය වේ. ආර්ථිකයේ සීඝ්‍රවත් වර්ධනයක් අත්කර ගැනීමට හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය, දැනුම සහ කුසලතාව පදනම් කරගත් ශ්‍රම බලකායක් අප රට තුල ස්ථාපිත කළ යුතුය. තවද තාක්ෂණය, දැනුම සහ කුසලතාවලින් පිරිපුන් ශ්‍රමිකයන් රැකියා සඳහා විදෙස්ගත කිරීම තුලින් රටේ පවතින වත්මන් ආර්ථික අර්බුදයට සාධනීය පිළියමක් ලබා ගැනීමට හැකිවනු ඇත. මේ තුළින් විදේශ විනිමය අර්බුදය සඳහා කෙටි කාලීන විසඳුමක් සැපයෙන අතර දීර්ඝ කාලීනව ඉහළ අතිදැකීම් සහ ව්‍යවසායකත්ව හැකියාවන්ගෙන් සමන්විත දක්ෂ ශ්‍රම බලකායක් මෙරට වර්ධනය වේ. විදේශ රැකියා ප්‍රවර්ධනය තුලින් විගමනික ප්‍රේෂණ වර්ධනය කර ගැනීම සඳහා කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

ශ්‍රමික අංශය, කම්කරු හා විදෙස් රැකියා අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් ප්‍රතිපත්ති සම්පාදනයට සහායවීම, ව්‍යාපෘති ඇගයීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබාදීම

හා ජාතික/ආංශික සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා දායකත්වය ලබා දේ. ඒ අනුව ශ්‍රමික අංශය 2023 වර්ෂය තුළ පහත සඳහන් කටයුතු අවසන් කරන ලදි.

- එක් ව්‍යාපෘති යෝජනාවක් ඇගයීම් කර විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර ව්‍යාපෘති යෝජනා දෙකක් ඇගයීම් කරමින් ඇත.
- කම්කරු හා විදෙස් රැකියා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 8ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- සංවර්ධනය සහ සහයෝගීතාව සඳහා ස්විට්සර්ලන්ත නියෝජිතායතනයේ සහය ඇතිව මුදල් අමාත්‍යාංශය සහ ILO අතර ගිවිසුමක ප්‍රතිඵලයක් ලෙස විදෙස් රැකියා විගමනිකයන් සඳහා හදිසි ඉවත් කිරීමේ ප්‍රතිචාර සැලැස්මක් සකස් කිරීමට සහයෝගය ලබා දෙමින් සිටි
- රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජතික ප්‍රතිපත්තිය සහ වර්ෂ 2023 – 2027 කාලසීමාව සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා දායකත්වය ද ලබාදෙන ලදී.

## 2.8 ප්‍රාදේශීය සංවර්ධනය

සුබිත මුදිත ගමක් / ප්‍රදේශයක් ගොඩනැංවීම අරමුණු කර ගනිමින් දිළිඳුකම පිටුදැකීමටත්, පවත්නා ප්‍රාදේශීය විෂමතාවන් අවම කරමින්, ප්‍රදේශයේ පවත්නා සුවිශේෂතාවන් හඳුනාගනිමින් සෑම ප්‍රජාවකගේම ජීවන තත්වය ඉහළ නැංවීම උදෙසා, අංශයට අදාළ ප්‍රතිපත්තිමය කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය යෙදවුම් (policy inputs) ලබා දීම සිදුකරයි. තවද, ආංශික හා මධ්‍යකාලීන සැලසුම් සැකසීම, ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘති පෙළ ගැස්ම සැකසීම ආදී කටයුතු ද ඉටු කරනු ලබයි.

ප්‍රාදේශීය සංවර්ධනයේදී, ගම හුදකලා කර සංවර්ධනය කරනවා වෙනුවට ගම සමග ප්‍රදේශ සම්බන්ධ කර කලාපයක් ලෙස සංවර්ධනය කිරීමත්, එලෙස සංවර්ධනය වූ කලාප අගනගර හා සම්බන්ධ කළ යුතු බව වර්තමාන සංවර්ධන ප්‍රතිපත්ති තුළින් අවධාරණය කර ඇත. ඒ අනුව, ජාතික මට්ටමේ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා, ඒ ඒ පළාත්වල පවතින සම්පත් ප්‍රශස්ත හා තිරසාර මට්ටමින් භාවිතයට ගැනීමේ වැදගත්කම මෙම අංශය මගින් අවධාරණය කෙරේ. මෙම අංශයේ උන්නතිය උදෙසා දේශීය අරමුදල්, විදේශ ණය හා විදේශ ප්‍රදාන (Grant Assistance) ද යොදා ගනු ලැබේ.

සියළුම පළාත් සභාවන් සඳහා, මුදල් කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම්වල දී මෙම අංශය විසින් අදාළ යෙදවුම්/ නිරීක්ෂණ ලබා දෙන ලදි.

.............................................................

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

ප්‍ර.ග.නි /ග.නි/ආයතන ප්‍රධානී අත්සන

# 03 පරිච්ඡේදය- 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත

## 3.1 මූල්‍ය කාර්ය සාධනය

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ඒසීඒ-එෆ් |
| | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | |
| | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | | | | |
| අයවැය 2023 | | සටහන | තත්‍ය | | |
| | | | | නැවත ගලපන ලද | |
| | | | 2023 | 2022 | |
| රු. | | | රු. | රු. | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 183,039,000 | 304,415,300 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 20,262,219 | 157,382 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 8,747,669 | 8,352,736 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 212,048,889 | 312,925,418 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 212,048,889 | 312,925,418 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 3,105,286 | 128,177,563 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 208,943,603 | 184,747,855 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| 100,127,991 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලා | 5 | 95,048,055 | 108,337,954 | |
| 31,706,199 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 31,040,275 | 33,416,395 | ඒසීඒ-2(ii) |
| 2,958,239,904 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 2,958,239,904 | 108,958,100,969 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 3,090,074,094 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 3,084,328,234 | 109,099,855,318 | |
| | මූලධන වියදම් | | | | |
| 3,834,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියු | 10 | 2,147,633 | 864,637 | |
| 96,165,384 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 11,377,135 | 5,753,519 | |
| 13,965,806,818 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 12,099,207,729 | 6,963,769,597 | ඒසීඒ-2(ii) |
| 2,114,353,125 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 2,114,353,125 | 41,465,777,225 | |
| 47,500 | හැකියා වර්ධනය | 14 | 47,500 | 173,000 | |
| 7,545,208,407 | වෙනත් මූලධන වියදම් | 15 | 7,409,605,493 | 8,079,370,749 | |
| 23,725,415,234 | මුළු මූලධන වියදම් (උ) | | 21,636,738,615 | 56,515,708,727 | |
| | තැන්පතු ගෙවීම් | | 17,926,671 | 157,382 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 5,310,771 | 5,760,643 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 23,237,442 | 5,918,025 | |
| 26,815,489,328 | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 24,744,304,291 | 165,621,482,070 | |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | -24,535,360,688 | -165,436,734,215 | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | | -24,535,360,688 | -165,436,734,215 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසීඒ-3 |
| | | | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 131,980,342 | 127,859,188 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 11,670,024 | 15,106,922 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **143,650,365** | **142,966,110** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 9,334,475 | 15,106,922 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 131,980,342 | 127,859,188 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 2,335,548 | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | **143,650,365** | **142,966,110** |

පිටු අංක 7 සිට 31 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 33 සිට 40 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ |
| නම : කේ.එම්. මහින්ද සිරිවර්ධන | නම : ආර්.එච්.ඩබ්.ඒ. කුමාරසිරි | අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| තනතුර : ලේකම් | තනතුර : අධ්‍යක්ෂ ජනරාල් | නම : ඩබ්.එස්.පී. ද මෙල් |
| දිනය : 2024.02. 22 | දිනය : 2024.02. 21 | දිනය : 2024.02. 21 |

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය

ඩබ්ලිව්.එස්.පී. ද මෙල්
ගණකාධිකාරි
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
පළමු මහල, මහලේකම් ගොඩනැගිල්ල
කොළඹ - 01

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | | ජ්සීජ්-සී |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | |
| | | |
| | තත්‍ය | |
| | | නැවත ගලපන ලද |
| | 2023 | 2022 |
| | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 1,489,528,269 | 9,943,825,651 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 5,257,944 | 5,965,003 |
| අග්‍රිම ලැබීම් | 183,039,000 | 304,415,300 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 6,151,289 | 5,638,363 |
| තැන්පතු ලැබීම් | 20,262,219 | 157,382 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 1,704,238,722 | 10,260,001,699 |
| | | |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,669,987,990 | 10,120,132,927 |
| සහනාධාර සහ මාරුකිරීම් | 976,976 | 1,308,933 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | - | 185,745 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 3,105,286 | 128,177,563 |
| අත්තිකාරම් ගෙවීම් | 5,581,605 | 4,285,631 |
| තැන්පතු ගෙවීම් | 17,926,671 | 157,382 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 1,697,578,528 | 10,254,248,181 |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | 6,660,194 | 5,753,519 |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| | | |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර | 6,660,194 | 5,753,519 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 6,660,194 | 5,753,519 |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | -6,660,194 | -5,753,519 |
| | | |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ | - | 0 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| | | |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| | | |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

### 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - -

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නොවේ

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| - | - | - | - | - | - |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 8,146,830,000 | 3,090,074,094 | 3,084,328,234 | 99.81 |
| ප්‍රාග්ධන | 2,772,000,000 | 23,725,415,234 | 21,636,738,615 | 91.20 |
| මුළු එකතුව | **10,918,830,000** | **26,815,489,328** | **24,721,066,848** | **92.19** |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | | අදාල නොවේ | | | | |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණය යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 33,810,000.00 | | |
| 9152 | වාහන | | 56,595,763.00 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ හා අනෙකුත් | | | | |
| 9153 | ඉඩම් | | 41,574,578.86 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව -

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව ඇමුණුම I ලෙස දක්වා ඇත.

# 04 පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති ගණන | | 78.57% | |
| අගයන ලද ව්‍යාපෘති යෝජනා ගණන | | 81.27% | |
| සපයන ලද නිරීක්ෂණ ගණන | 99.69% | | |
| අගයන ලද ජාතික/ උප ජාතික සැලසුම් ගණන | 100% | | |

# 05 පරිච්ඡේදය- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස ආර්ථිකමය සහ සාමාජීය වශයෙන් වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අංශ 9කට සහ උප අංශ 26කට වෙන් කර ඇත.එක් එක් අංශය ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් සිදුකරනු ලබන ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු නිර්දේශවලට යටත්ව සිදු කෙරේ. ඒ අනුව, අදාළ අමාත්‍යාංශ මගින් මූලික අනුමැතිය ලබා ගැනීම සඳහා රු.මිලියන 10ට වැඩි සියළුම ව්‍යාපෘති වාර්තා අදාළ ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියට අනුව මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි. එම ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ ආකෘතියේ සඳහන් වන 11 වන කාණ්ඩය අනුව යෝජිත ව්‍යාපෘති මඟින් තිරසර සංවර්ධන අරමුණු වලට දක්වන දායකත්වය පිළිබඳව ඇගයීමට ලක් කරනු ලැබේ. ඒ අනුව, දර්ශක 244 කින්, ඉලක්ක 169 කින සහ අරමුණු 17 කින් සමන්විත 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයට අදාළ

සියළු තිරසර සංවර්ධන අරමුණු (17), ඉලක්ක සහ ප්‍රතිපත්තිමය තීරණ මෙම දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ඇගයීමේදී සලකා බලනු ලබයි.

තවද, තිරසර සංවර්ධන අරමුණු දැනටමත් ගෝලීය වශයෙන් හඳුනාගෙන ඇති අතර එම අරමුණු අපගේ සංවර්ධන ක්‍රියාදාමයට අනුගත කර ගැනීම සිදු කරයි.එබැවින්, මෙම දෙපාර්තමේන්තුවට අදලව තිරසර සංවර්ධන අරමුණු වෙනම හඳුනාගැනීමක් සිදු කරනු නොලැබේ.ඒ අනුව, රාජ්‍ය ආයෝජන සැලැස්ම , සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු 17ට අනුගත වෙමින් සකස් කරනු ලැබේ. එසේම, එක් එක් අමාත්‍යාංශ සහ ආයතන මඟින් සංවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමේදී එම ආයතන සඳහා අදාළ වන තිරසර සංවර්ධන අරමුණු ඒ සඳහා අනුගත කරගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ලබා දේ.

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන සභාව සමඟ සහයෝගීත්වයෙන් සියළුම අමාත්‍යාංශ සම්බන්ධීකරණ යෙන් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සංබන්ධීකරණය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරයි.

ඒ අනුව, 2023 වර්ශයේ දී තිරසර සංවර්ධන අරමුණු යටතේ ශ්‍රී ලංකාවට අදාළ ඉලක්ක සහ දර්ශකයන් හඳුනාගැනීමටත් එම දර්ශකයන්ට අදාළ 2030 දී ශ්‍රී ලංකාව ලඟා කරගැනීමට බලාපොරොත්තුවල ඉලක්ක හඳුනාගැනීම 2023 වර්ශයේ දී සිදුකරන ලදී. මෙහි දී, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ විෂයපතයට අයත්වන තිරසර සංවර්ධන දර්ශකයන්ට අදාළ ඉලක්ක හඳුනාගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් අදාළ මහා භාන්ඩාගාර දෙපාර්තමේන්තු සහ ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරන ලදී. එම දෙපාර්තමේන්තුවල තොරතුරු සහ පුරෝකතනයන් පදනම්කරගනිමින් ඉලක්ක හඳුනාගත හැකි ඉලක්ක තිරසර සංවර්ධන සභාව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

## 06 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 59 | 41 | 18 |
| තෘතීයික | 01 | 01 | 0 |
| ද්විතියික | 33 | 27 | 06 |
| ප්‍රාථමික | 31 | 26 | 05 |

### 06.2 ** ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සහ කාර්ය සාධනය අතර සම්බන්ධතාවය.

ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින මානව සම්පත් හිඟය හේතුවෙන් එක් නිලධාරියෙකුට අංශ කිහිපයක රාජකාරි ආවරණය කිරීමට සිදුවීමෙන් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට කාර්යාල වේලාවෙන් බැහැරවත් රාජකාරි ඉටුකිරීමට සිදුවෙයි.

### 06.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ආර්ථික සංවර්ධනය, පරිපාලනය සහ බලපෑම් වර්ධක උපායමාර්ග | 03 | 04 දින | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| උසස් ඉංග්‍රිසි ඩිප්ලෝමාව | 01 | 01 අවුරුදු | 25,000 | | දේශීය | ඉංග්‍රිසි භාෂාව පිළිබඳ නිපුනතාවය ලැබීම |
| දෙමළ භාෂා පුහුණුව | 06 | පැය 100 | | | දේශීය | දෙමළ භාෂාවෙන් රාජකාරි කටයුතු කිරීම සඳහා අවශ්‍ය නිපුනතාවය ලබා ගැනීම |
| Beyond the water | 01 | 01 දින | | | දේශීය | නිල රාජකාරි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| meter | | | | | | පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Geographical Information System | 13 | 04 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| A multi-country workshop to support the implementation of ICD-II | 01 | 04 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Validation of Carbon Net Zero 2050 Roadmap and Stratergic Plan | 02 | 01 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Environment Impact Assesment (EIA) | 01 | 02 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Potential of Renewable Energy Applications and Implementation of Energy Management Systems(EnMS) for Industries | | | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Supporting sustainable Reintegration of returnee migrant workers in Sri lanka | 01 | 02 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Implementaion of the National Nuclear or Radiological Emargency Management Plan(EMP) | 01 | 02 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Project Formulation Procurement and Contract Administration of externally funded project in Sri lanka | 01 | 01 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| National Evaluation | 03 | 03 දින | | | දේශිය | නිල රාජකාරි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Policy Implemantation Framework(NEPIF) | | | | | | පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Women, Peace,Securrity වැඩමුළුව | 01 | 01 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| ජනගහන ප්‍රක්ෂේපනය පිළිබඳ වැඩමුළුව | 02 | 04 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Transformation of Libraries in the digital Era | 01 | 01 දින | 2,500 | | දේශිය | පුස්තකාල කටයුතු නවීන තාක්ෂණය අනුව පවත්වාගෙන යාම සම්බන්ධ දැනුම වර්ධනය වීම |
| Introduction to Effective use of AI | 01 | 01 දිනක් | | | දේශීය | කෘතිම බුද්ධිය භාවිතය පිළිබඳ දැනුම වර්ධනය වීම |
| Logical Framework approach | 19 | 03 දින | | | දේශීය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Training for IT Officers | 01 | 01 දිනක් | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| Economic Analysis | 19 | 03 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම |
| සියළුම නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩමුළුව | 66 | 02 දින | | | දේශිය | නිල රාජකාරි පිළිබඳ දැනුම සහ ආකල්ප වැඩිදියුණු කිරීම |
| Knowledge exchange and possible collaborations primary care services | 01 | 08 දින | | | විදේශිය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Financing sustainable development in Asia-Pacific region in times of volatility and uncertainties | 01 | 03 දින | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Working Group Meetings for the South Asia Subregional Economic Cooperation (SASEC)Program | 01 | දින 05 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Working Group Meetings for the South Asia Subregional Economic Cooperation (SASEC)Program | 01 | දින 02 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| ADB: Regional Workshop on Transforming Policy and Investment through Mainstreaming Natural Capital Assesment and Accounting | 01 | දින 03 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Regional wokshop on Integrating Policy and Data to Leave no one behind | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Study tour to Thailand on Social Protection | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| South South exchange | 01 | දින 02 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Workshop on public finance management for social protection | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Conference on regional cooperation and integratrion strengthening Regional Cooperation and Integration through Economic Corridor Development | 01 | දින 03 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| South Asia regional workshop on Economic Analysis of Investment Projects | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| US Consultation to improve University-Industry linkages | 01 | දින 09 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Regarding the Invitation Program for Policy Development Expert on Employment Support for Vocational Training and Education Trainees utilizing Technical and Vocational Education and Training (TVET) Career Platform | 01 | දින 07 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Regional Higher Education Forum (Higher Education of the future: Leading Digital and Green Transformations through collaboration) | 01 | දින 03 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Workshop on the sustainable, Inclusive and resilient tourism recovery and Development in the Asia and the | 01 | දින 02 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Pacific | | | | | | |
| ADB : South Asia regional training on Economic analysis of investment projects | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Counterpart Training under the JICA technical cooperation project for mainstreaming disaster risk reduction through establishing local disaster risk reduction plans based on river basin strategy | 01 | දින 12 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Green Public Procurement and Ecolabel for Circular Economy | 01 | දින 12 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Macroeconomics of climate change | 01 | දින11 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Carbon peak, carbon neutrality and green economy for developing countries | 01 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| ADB : Asia Pacific Social Protection week 2023, Social Protection in a Changing World | 01 | දින 03 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Poverty Reduction and Development under the Global Development Initiative | 01 | දින10 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Leading Digitally Connected Supply Chains of the Future | 01 | දින 12 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Seminar on Low Carbon Development and Ecological Conservation for Belt and Road Countries | 01 | දින14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Macroeconomics Diagnostics | 01 | දින 12 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Tourism Management for Sri Lanka | 01 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Regional Workshop on Population Projections | 01 | 05 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| ITEC International Training Program on Geo Informatics Applications in Rural Development | 01 | දින 28 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| ADB : TA6627 Regional Training Workshop on Delivering Climate Solutions for South Asia | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| JICA Knowledge Co-Creation Program Promotion of Mainstreaming Disaster Risk Reduction | 01 | දින 18 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| ADB: Regional Conference on Community based care model : Learning from Developing | 01 | දින 04 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Member countries experience | | | | | | |
| ITEC - International Training Program on Financial Inclusion & Digital Transformation | 02 | දින 28 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Seminar on Low Carbon Development and Ecological Conservation for Belt and Road Countries | 01 | දින 14 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Knowledge Sharing Program for South Asian Countries on Sharing of Republic of Korea's Experiences on Clean Energy Transition | 01 | දින 05 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |
| Master of Development Studies - University of Queensland | 01 | අවුරුදු 01 | | | විදේශීය | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට දැනුම දායක කර ගැනීම |

## 07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | **අනුකූල වේ** | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | **අනුකූල වේ** | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | **අදාල නොවේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | **අදාල නොවේ** | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | **අදාල නොවේ** | | |
| 1.6 | වෙනත් | **අදාල නොවේ** | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේක267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | **අනුකූල වේ** | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| | දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම්සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අදාල නොවේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අදාල නොවේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | **අනුකූල වේ** | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | **අනුකූල වේ** | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | **අනුකූල වේ** | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | **අනුකූල වේ** | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | **අනුකූල වේ** | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | **අනුකූල වේ** | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | **අනුකූල වේ** | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| | එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | **අනුකූල වේ** | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | **අනුකූල වේ** | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | **අනුකූල වේ** | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | **අදාල නොවේ** | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | **අනුකූල වේ** | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | **අදාල නොවේ** | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම | **අනුකූල වේ** | | |

| | | | | |
|---|---|---|---|---|
| | සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

**අවසානය.**

Annex 1

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| මගේ අංකය<br>எனது இல.<br>My No. | TPD/B/NPD/02/23/16 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024 මැයි 28 දින |
|---|---|---|---|---|---|

ගණන්දීමේ නිලධාරී

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා නොගෙන මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (237-1-1-0-2002-0/11) සඳහා මු.රෙ 66 මගින් රු. 834,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ආ) මූලික ඇස්තමේන්තුවෙන් ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කර නොගෙන වැය විෂයයන් 02 ක් සඳහා එකතුව රු.36,212,297 ක්, පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන හා මු.රෙ. 66 මගින් අමතර ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර, එය එම වැය විෂයන්ගේ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 33 සිට 527 ක් දක්වා වූ පරාසයක් විය.

(ඇ) ලෝක ආහාර වැඩසටහන (WFP), ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂයේදී වැය විෂය අංක 237-1-2-2-2202-0/13 සඳහා රු.1,250,000,000 ක් ද, වැය විෂය අංක 237-1-2-2-2202-0/17 යටතේ රු.550,000,000 ක් වශයෙන් එකතුව රු.1,800,000,000 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා දී තිබුණ ද, 2023 වර්ෂයේදී මෙම වැඩසටහන, ජනාධිපති කාර්යාලය මගින් ක්‍රියාත්මක කිරීමට තීරණය කර, ඒ සඳහා ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂයට අතිරේක ප්‍රතිපාදන සලසා දී තිබුණ ද, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ඉහත වැය විෂයන් දෙක සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන එකතුව වූ රු.1,800,000,000 ක මුදල් ප්‍රමාණය අවුරා තැබීමක් සිදු වී නොතිබුණි. එබැවින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ ඉහත වැය විෂයන් දෙක යටතේ වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණයම ඉතිරිවීම් ලෙස දක්වා තිබුණි.

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය - XIX පරිච්ඡේදයේ 6.14 වගන්තිය හා නිල නිවාස ගිවිසුමේ 05 වගන්තිය ප්‍රකාරව රජයේ නිලධරයෙකුට මාරුවීම, විශ්‍රාමයාම ආදී කරුණු නිසා එම රජයේ නිවාසයේ පදිංචිවීම සඳහා ඇති සුදුසුකම අහෝසි වූ

වහාම නිවාසයන් හි පදිංචිය හිස් කොට ආපසු දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතුය. එසේ වුවත් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුව සිට වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරිනියක් ස්ථාන මාරුවී මාස 09 ක් ගතවී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ නිල නිවාසය දෙපාර්තමේන්තුව වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් මාර්ගෝපදේශයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කළ යුතු වගකීම් ක්ෂේත්‍රය හා ක්‍රියාකාරකම් දක්වා තිබුණ ද, ඒ සඳහා වගකිවයුතු නිලධාරියා පිළිබඳව සඳහන් කර නොතිබුණි.

#### 3.1.2 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ විදේශ ණය/ ආධාර යොදවා ක්‍රියාත්මක කරන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ වැය විෂය අංක 237-1-1-20-2106-0/13 සඳහා 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු.34,788,249 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනයෙන් තොරව ඉතිරි වී තිබුණි.

(ආ) ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කිරීමේදී වැරදි වැය විෂයයන් යටතේ ප්‍රතිපාදන සලසා තිබීම, ව්‍යාපෘති අවසානයේදී බිල්පත් පියවීම හා ඇස්තමේන්තු කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි හේතු මත ව්‍යාපෘති 04 ක් සඳහා මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොගෙන වැය විෂයන් 11 ක් සඳහා එකතුව රු. 21,248,932,166 ක් සමාලෝචිත වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන හා මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරනු ලබන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය හා ශ්‍රී ලංකාවේ වෙළඳපල සංධානය (PALAM/A) ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන එකතුව වූ රු. 8,902,500,000 කින් එකතුව රු. 7,443,648,823 ක් එම ව්‍යාපෘතිවල වෙන් කරන ලද වැය විෂයයන්ගෙන් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණි. එම මාරු කරන ලද ප්‍රමාණය වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 82 ක සිට සියයට 100 ක පරාසයක පැවතුණු අතර, වැරදි වැය විෂයයන් යටතේ වූ ඇස්තමේන්තු ප්‍රතිපාදන සිදු කර තිබීම හා ප්‍රතිපාදන අවශ්‍ය නොවීම වැනි කරුණු, මේ අයුරින් ප්‍රතිපාදන මාරු කිරීමට බලපා තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

(අ) රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව, මිල සැඳහුම් ක්‍රමයට ප්‍රසම්පාදන කිරීමේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කළ යුතු වුවද, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේදී අවස්ථා 14 ක දී එකතුව රු.2,008,935 ක් වූ භාණ්ඩ ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමෙන් තොරව මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

දෙපාර්තමේන්තුවේ නිලධාරිනියක වෙත 2013 මැයි මස 09 දින ලබා දුන් රු.103,000 ක් වටිනා Toshiba වර්ගයේ ලැප්ටොප් පරිගණකය 2014 ජුලි මස 22 දින නිලධාරිනියගේ නිවසේදී අස්ථානගත වී තිබූ අතර, විගණිත දිනය වූ 2024 අප්‍රේල් 18 දින වන විට වසර 09 මාස 09 ක පමණ කාලයක් ගතවී ඇතත් දෙපාර්තමේන්තුව විසින් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3.2 වාහන**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙපාර්තමේන්තුව සතු වාහන 04 ක් දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා යොදවා නොගෙන මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා සංවර්ධන මුල්‍ය දෙපාර්තමේන්තුව වෙත විධිමත් පවරා දීමකින් තොරව ලබා දී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ හි 3.1 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන 03 කට අදාළව ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ WP KQ 6923 සහ WP KP 5871 අංක දරන මෝටර් රථ සමාලෝචිත වර්ෂයේදී අනතුරු සඳහා භාජනය වී, 2024 අප්‍රේල් 10 දින වන විට පිළිවෙලින් මාස 08 ක් හා මාස 04 ක කාල සීමාවක් ගතවී තිබුන ද අදාළ මොටර් වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුණ අතර මෝටර් රථවලට සිදු වූ අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**3.4 කළමනාකරණ දුර්වලතා**

දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු, නිල නිවාස අපේක්ෂාවෙන් දීර්ඝකාලීනව පොරොත්තු ලේඛනයේ රැඳී සිටින නිලධාරින් සිටියදී 2017 නොවැම්බර් 30 දින නිලධාරිනියක වෙත ලබා දී තිබූ නිල නිවස, 2021 ජනවාරි මස එම නිලධාරිනිය ස්ථාන මාරු වී ගිය පසු, එම දෙපාර්තමේන්තුවේම සේවය කළ එම නිලධාරිනියගේ කලත්‍රයා වෙත ලබා දී තිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යමණ්ඩල දත්ත අනුව 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 28 ක් වූ අතර, පුරප්පාඩු පිරවීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට සමාලෝචිත වර්ෂයේදී පියවර ගෙන නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ 13.3 වගන්තිය ප්‍රකාරව, තනතුරකට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ පුස්තකාලාධිපති තනතුර අවුරුදු 10 කට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් තොරතුරු අනුව 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තත්‍ය සේවක සංඛ්‍යාව 42 තුළ, රා.ප.චක්‍ර 14/2022 අනුව වසර 5 ක විදේශ නිවාඩු ලබා ගත් නිලධාරීන් දෙදෙනෙක්, සේවය හැරගියා සේ සලකනු ලබන නිලධාරීන් එක් අයෙක් සහ විධිමත් අනුමැතියකින් තොරව වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාගත් නිලධාරියෙකුද ඇතුළත්ව තිබුණි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ සත්‍ය වශයෙන්ම සිටින සේවක සංඛ්‍යාව 38 ක් විය. එය අනුමත තොරතුරු සංඛ්‍යාවෙන් සියයට 64 ක් බව නිරීක්ෂණය විය.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට